විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
விஞ்ஞான மற்றும் தொழினுட்ப அமைச்சு
Ministry of Science and Technology

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயற்றிறன் அறிக்கை
Annual Performance Report
2025



වාර්ෂික කාර්යසාධන වාර්තාව

2025

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය – 196

අන්තර්ගතය

		පිටු අංකය
පරිච්ඡේදය 01 -	**ආයතනික පැතිකඩ / විධායක සාරාංශය**	1
පරිච්ඡේදය 02 -	**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	6
පරිච්ඡේදය 03 -	**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශ**	26
පරිච්ඡේදය 04 -	**කාර්යසාධන දර්ශක**	42
පරිච්ඡේදය 05-	**තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය**	43
පරිච්ඡේදය 06 -	**මානව සම්පත් පැතිකඩ**	48
පරිච්ඡේදය 07-	**අනුකූලතා වාර්තාව**	52

පරිච්ඡේදය 01
ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

1.1 . හැඳින්වීම

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය, ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සහ සමාජ යහපැවැත්මේ ප්‍රධාන සක්‍රීයකාරකයන් ලෙස විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය (STI) පුළුල් කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය (MoST) අඛණ්ඩව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරමින් සිටියි. ආර්ථිකය ප්‍රකෘතිමත් තත්ත්වය කරා රැගෙන යාම, දේශගුණික ආතති තත්ත්වයන් සහ වේගවත් තාක්ෂණික විපර්යාස සඳහා මුහුණ දීමට සිදු වී ඇති පසුබිමක, විද්‍යාත්මක ප්‍රගතියේ ප්‍රතිලාභ සමාජයේ සියලුම කොටස් වෙත ළඟා වන බව සහතික කිරීම සඳහා සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය, ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ සහ සමාජයේ සියලු කොටස් සඳහා ප්‍රතිලාභ අත්කර දෙන නවෝත්පාදනයන් නිරන්තරයෙන් දියුණු කිරීමට අමාත්‍යාංශය විසින් පියවර ගනු ලැබ ඇත.

2024 වසරේ මුල් මාස දහය තුළ අධ්‍යාපන අමාත්‍යාංශය තුළ අංශයක් ලෙස ක්‍රියාත්මක වුවද, වසරක් ඇතුළත සිය සම්පූර්ණ ආයතනික ව්‍යුහය සාර්ථකව නැවත ස්ථාපිත කර ගැනීමට අමාත්‍යාංශය සමත්ව ඇත. 2024 නොවැම්බර් 25 දිනැතිව නිකුත් කරනු ලැබූ අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය හරහා අමාත්‍යාංශය යලි පිහිටුවීම තීරණාත්මක ආයතනික සන්ධිස්ථානයක් සනිටුහන් කළ අතර එමඟින් නව උපායමාර්ගික දැක්මක් සහ පාලන ස්වාධීනත්වයක් නිර්මාණය කර ගැනීමට හැකියාව උදා විය. මෙම සංක්‍රාන්ති අවධියෙ හි පසු වුවද, පර්යේෂණ, නවෝත්පාදන, ප්‍රතිපත්ති සම්පාදනය සහ ජාත්‍යන්තර සහයෝගිතාව යන අංශයන් හරහා අඛණ්ඩතාව, ආයතනික ඔරොත්තු දීමේ හැකියාව සහ සවිමත් අයුරින් ඉලක්ක සපුරාගැනීමේ ධාරිතාව ප්‍රදර්ශනය කරමින් 2025 වර්ෂය පුරා සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කිරීමට අමාත්‍යාංශය සමත් වී ඇත.

මෙම අමාත්‍යාංශයේ මූලාරම්භය 1968 දී ජාතික විද්‍යා කවුන්සිලය පිහිටුවීමත්, ඉන් අනතුරුව 1981 දී NARESA ආයතනය පිහිටුවීමත්, 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනත යටතේ අමාත්‍යාංශයක් ලෙස නිල වශයෙන් පිහිටුවීමත් දක්වා දිව යන්නකි. ගෙවීගිය දශක ගණනාවක කාලය තුළ, මෙම අමාත්‍යාංශය විවිධ ආකෘතීන් ගණනාවක් යටතේ ක්‍රියාත්මක වී ඇති අතර, වෙනස් වන ජාතික ප්‍රමුඛතාවන්ට අනුව කැබිනට් අමාත්‍යාංශයක් සහ කැබිනට් නොවන අමාත්‍යාංශයක් ලෙසත් ක්‍රියාත්මක වී ඇත. මෙම ක්‍රමික විකාශනය පුරාම, විද්‍යාත්මක හැකියාවන්, තාක්ෂණික සංවර්ධනය සහ නවෝත්පාදනයන් මත පදනම් වූ ජාතික පරිවර්තනය ඉදිරියට රැගෙන යාමේ ප්‍රධාන නියමුවෙකු ලෙස සිය කාර්යභාරය ඉටු කිරීමට අමාත්‍යාංශයට හැකි වී ඇත.

2025 වසරේ දී, අමාත්‍යාංශය යටතේ ඇති ආයතනික භූ දර්ශනය තවදුරටත් පුළුල් වූ අතර ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB) සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (SLAERC) ඇතුළත් කිරීමත් සමඟ, ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය සහ රට පුරා ක්‍රියාත්මක විද්‍යා වැඩසටහනට අමතරව ආයතන 14 ක අධීක්ෂණ කටයුතු අමාත්‍යාංශය විසින් මේ වන විට සිදු කරයි. මෙම පුළුල් වූ කාර්යභාරය හේතුවෙන් නැගී එන විද්‍යාත්මක හා තාක්ෂණික අභියෝග සඳහා ශ්‍රී ලංකාවේ සූදානම තවදුරටත් ශක්තිමත් වූ අතර ප්‍රමුඛ විද්‍යාත්මක ක්ෂේත්‍ර, නියාමන අධීක්ෂණය සහ උපායමාර්ගික තාක්ෂණයන්හි ජාතික ධාරිතාවයද සවිමත් කෙරිණි.

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA), ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS), ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC), නවීන තාක්ෂණය පිලිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT), ජාතික විද්‍යා පදනම (NSF) සහ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම (NASTEC) ඇතුළු අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රමුඛ ආයතන, පර්යේෂණ විශිෂ්ටත්වය, ව්‍යවහාරික නවෝත්පාදනය, තාක්ෂණ පැවරුම් සහ ප්‍රතිපත්ති උපදේශන කාර්යයන් හා අදාලව සාමූහිකව සැලකිය යුතු අන්දමේ විශිෂ්ට ප්‍රතිඵල අත්කර දීමට සමත්ව ඇත. මෙම ආයතන විසින් කර්මාන්ත-ශාස්ත්‍රීය සහයෝගිතාව ඉහල නැංවීම, වාණිජකරණ මාර්ග ශක්තිමත් කිරීම, විද්‍යාත්මක සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම සහ කෘෂිකර්මාන්තය, ඉංජිනේරු විද්‍යාව, ඩිජිටල් තාක්ෂණයන්, අභ්‍යවකාශ විද්‍යාව සහ නැගී එන කාර්මික අංශ හරහා ජාතික සංවර්ධන ප්‍රමුඛතාවයන්ට සහාය වීම සිදු කරන ලදී.

2025 වර්ෂයේදී අත්කර ගත් සුවිශේෂී ජයග්‍රහණයක් වූයේ ජාතික අයවැය යටතේ රුපියල් මිලියන 750 ක ප්‍රතිපාදන මගින් සහාය දක්වන ලද ජාතික තත්ත්ව යටිතල පහසුකම් (NQI) ශක්තිමත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම වූ අතර ඒ හරහා එම වසර තුළදී මූල්‍ය හා භෞතික ප්‍රගතියෙන් ආසන්න වශයෙන් සියයට 99 ක් අත්කර ගැනීමට හැකි විය. NQI වැඩසටහන යටතේ වෙනස් සහ විමධ්‍යගත ප්‍රවේශයක් අනුගමනය කරමින්, ප්‍රමිතිකරණය, අනුකූලතා තක්සේරුව, පරීක්ෂා කිරීම, සහතිකකරණය සහ තත්ත්ව සහතික පද්ධති ශක්තිමත් කිරීම සඳහා ජාතික ආයතන සහ විශ්වවිද්‍යාල හරහා උපායමාර්ගිකව තෝරාගත් ව්‍යාපෘති 27 කට අරමුදල් සපයාදෙන ලදී. මෙය දීප ව්‍යාප්ත අයුරින් ක්‍රියාත්මක වීම හේතුවෙන්, තත්ත්ව යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් හරහා ආහාර සුරක්ෂිතතාව, නිෂ්පාදනය, අපනයන, ඉදිකිරීම් සහ නැගී එන තාක්ෂණයන් ඇතුළු බහු කලාප සහ අංශවලට ප්‍රතිලාභ සැලසිනි. මෙම වැඩසටහන නියාමන බාධක අවම කරමින් ආයතනික සූදානම සැලකිය යුතු ලෙස වැඩිදියුණු කළ අතර, කලාපීය සහ ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරහකාරිත්වය ශක්තිමත් කිරීමට මුල්විය.

ජාතික පර්යේෂණ මෙහෙයවීම ශක්තිමත් කිරීම මූලික ප්‍රමුඛතාවයක් ලෙස පැවතුනි. 2025 වසර තුළදී අමාත්‍යාංශය විසින් ජාතික පර්යේෂණ මාර්ග සිතියමක් සහ පර්යේෂණ ඇගයීම සහ ආචාර ධර්ම සමාලෝචනය සඳහා ජාතික මාර්ගෝපදේශයක් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලද අතර, ඒ සඳහා විද්වතුන් 190 කට අධික සංඛ්‍යාවකගේ සහාය ලැබුණි. ඊට සමගාමීව, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සමඟ සහයෝගීතාවයෙන් ජාතික පර්යේෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (NRMIS) ස්ථාපිත කිරීම අමාත්‍යාංශය විසින් ආරම්භ කරනු ලැබූ අතර, ඒ හරහා ඒකාබද්ධ, විනිවිදභාවයෙන් යුක්ත සහ දත්ත මත පදනම් වූ ජාතික පර්යේෂණ කළමනාකරණ වේදිකාවක් සඳහා අඩිතාලම දැමිණි.

විද්‍යාව ප්‍රචලිත කිරීම සහ සමාජයේ සියලු කොටස් ඉලක්ක කරගත් නවෝත්පාදනයන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීම අඛණ්ඩව සිදුවිය. 2025 ජාතික විද්‍යා සතිය, දීප ව්‍යාප්ත මට්ටමින් සිදුකළ වැඩසටහන් හරහා සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර, විද්‍යාත්මක වැඩසටහන යටතේ සියලු දිස්ත්‍රික්ක හරහා බිම් මට්ටමේ තාක්ෂණ හුවමාරුව, ව්‍යවසායකත්ව සහාය, තත්ත්ව සහතිකකරණ පහසුකම් සැපයීම සහ නවෝත්පාදන සඳහා තාක්ෂණ සේවා හා ආධාර සැපයීම පුළුල් කෙරිණි. පාසල් මට්ටමින් හා තරුණ කොටස් ඉලක්ක කරගනිමින් දියත් කල පාසල් තරුණ නවනිපැයුම් සමාජ, ජාතික හැකතන් තරඟාවලිය සහ ප්‍රජා පාදක තාරකා විද්‍යා වැඩසටහන් වැනි මූලාරම්භයන් හරහා මුල් අවධියේ නවෝත්පාදන සංස්කෘතිය සහ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) අංශ කෙරෙහි උනන්දුවක් ඇති කිරීමට අවකාශ සැලසිණි.

ජාත්‍යන්තර වශයෙන්, චීනය, ඉන්දියාව, බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල්හි බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාවය සඳහා වන මූලාරම්භය (BIMSTEC), ඉන්දියන් සාගර තීරය ආශ්‍රිත රටවල් හි සංගමය (IORA) සහ අනෙකුත් උපායමාර්ගික හවුල්කරුවන් සමඟ එළැඹී ප්‍රධාන ගිවිසුම් ඇතුළුව පුළුල් කරන ලද ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සහයෝගීතාවය හරහා විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයේ රාජ්‍ය තාන්ත්‍රිකභාවය ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය විසින් පියවර ගනු ලැබිණි. මෙම සහයෝගීතාවයන් හරහා පර්යේෂණ ධාරිතාව, තාක්ෂණ පැවරුම් සහ ගෝලීය දැනුම හුවමාරුව වර්ධනය වීම සිදු විය.

2025 වර්ෂය සඳහා වන මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව හරහා මෙකී ජයග්‍රහණ, ආයතනික කාර්යසාධනය සහ වැඩසටහන් හී ප්‍රතිඵල පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කෙරෙන අතරම, 2026 වර්ෂය සඳහා වන උපායමාර්ගික ප්‍රමුඛතා ගෙන හැර දක්වා ඇත. සාමූහිකව ගත් කල, මේ සියල්ල හරහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය ජාතික සංවර්ධනයට උපායමාර්ගිකව බද්ධ කිරීම තුළින් ඔරොත්තු දීමට සමත්, සමාජයේ සියලු කොටස් ඇතුළත් සහ නවෝත්පාදන මත පදනම් වූ ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා අමාත්‍යාංශයේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කෙරේ.

1.2. දැක්ම සහ මෙහෙවර

දැක්ම

විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය තුළින් සංවර්ධිත දේශයක්


මෙහෙවර

තිරසර සංවර්ධන රාමුව තුළ ජාතික සහ ගෝලීය අභියෝග සඳහා විසඳුම් සපයා දෙමින්, ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ආර්ථික වර්ධනයක් අත්කර දීමට සමත් ඵලදායී විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම.

1.3. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රමුඛතා කාර්යයන්

- රජය විසින් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තීන් මත පදනම්ව, විද්‍යා හා තාක්ෂණ විෂයයන් සම්බන්ධව ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම
- අමාත්‍යාංශයේ විෂය පථය යටතේ මහජන සේවාවන් කාර්යක්ෂමව සහ ජනතා හිතකාමී ලෙස සැපයීම
- නවීන කළමනාකරණ ශිල්පීය ක්‍රම සහ තාක්ෂණය යොදා ගනිමින් සියලු පද්ධතීන් සහ ක්‍රියා පටිපාටි ප්‍රතිසංස්කරණය කිරීම හරහා දූෂණය හා නාස්තිය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු වන බව සහතික කිරීම
- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැලසීම
- නවෝත්පාදන සහ පර්යේෂණයන්හි ප්‍රතිඵල උපයෝගී කර ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සම්පාදනය කිරීම
- විද්‍යාත්මක, කාර්මික, සමාජීය සහ ආර්ථික පර්යේෂණ සහ සංවර්ධන කටයුතු පුළුල් කිරීමට පියවර ගැනීම
- නවෝත්පාදනයන් උදෙසා ප්‍රජාවන් පෙළඹවීම සහ යොමු කිරීම
- විද්‍යා හා තාක්ෂණ අංශයේ පරිපාලනයට අදාළ ප්‍රමිති සහ කරුණු බලාත්මක කිරීම
- හරිත තාක්ෂණ ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා අදාළ අමාත්‍යාංශවලට තාක්ෂණික සහාය ලබා දීම

1.4. සංවිධාන ව්‍යුහය


Secretary
Add. Sec. (Admin)
Add. Sec. (Dev.)
DG (Research)
DG (Planning)
CFO
CIA
Director (IT)
SAS (Vidatha)
SAS (Admin)
Director (Vidatha)
Director (IR)
Director (Dev.)
Director (Planetarium)
Director (S&TT)
Director (Research)
Director (Planning)
Director (Vidatha)
CA (Vidatha)
CA
DD/AD
DD/AD (S&TT)
DD/AD (IR)
AD/DD SLAS - 2
AD *
AD (Digital Planetarium) *
AD/DD SLAS - 1
DD/AD 1
DD/AD 2
DD /AD (Vidatha)
Asst. Direc
AS (Vidatha)
AS 1
AS 2
Asst. Eng.(Civil)
AO
AO (Vidatha)
AO (Planetarium)
IA
Account (Payment)
Account 2
Account 1
System Analyst *
DVO
Translator
Legal Officers
Lecturer
ICT Officer
DO
Driver
MSO
Computer Operator
OES
Asst. Planetarium Technician
Planetarium Technician
S&T Planning Asst.
TO
Field Coordinator
Electrical & AC Mechanic
STO
Video Cameraman
Astronomy Demonstrator
Skill Photographer
Asst. Officer In charge
ICT Assistant
Watcher

1.5. *විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන*

- නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT)
- කාර්මික තාක්ෂණ ආයතනය (ITI)
- ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC)
- ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)
- ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA)
- ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)
- ජාතික පර්යේෂණ සභාව (NRC)
- ජාතික විද්‍යා පදනම (NSF)
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB) *
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (SLAERC) *
- ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC)
- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)
- ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (SLINTEC)
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

** 2025 අංක 2458/65 හා 2025.10.18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතට පවරාගනු ලද නව ආයතනයන්.*

1.6. විදේශ ආධාර ලබන ව්‍යාපෘති පිළිබඳ විස්තර

අදාළ නොවේ.

පරිච්ඡේදය 02
ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

2.1. 2025 වසරේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ජයග්‍රහණ

විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන

- **විද්‍යාව හා තාක්ෂණය ප්‍රචලිත කිරීමේ වැඩසටහන**

  - **අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සමඟ සහයෝගීතාවයෙන් ජාතික විද්‍යා දින සැමරුම් සංවිධානය කිරීම**

"විශ්වාසය ගොඩනැගීම, පරිවර්තනය මෙහෙයවීම; ශ්‍රී ලංකාවේ හෙට දවස සඳහා විද්‍යාව " යන තේමාව යටතේ 2025 ජාතික විද්‍යා දිනය සහ විද්‍යා සතිය නොවැම්බර් 10 සිට 14 දක්වා කොළඹදී පැවැත්විණි. අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතන, රාජ්‍ය විශ්වවිද්‍යාල, විද්‍යාත්මක සංගම් සහ පෞද්ගලික අංශය සහභාගීත්වයෙන් විද්‍යා සතිය පුරා වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

- **ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සහයෝගීතාවයන් යටතේ ඇති කර ගනු ලැබූ විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවන්**

  - **ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන (2019) ක්‍රියාත්මක කිරීම - අවසන් අදියර**

2019 දී කැඳවන ලද යෝජනා වලින් තෝරාගත් පර්යේෂණ ව්‍යාපෘති හයක් සඳහා මෙම වසරේ ප්‍රගති සමාලෝචන සහ මූල්‍ය සහාය ලබා දෙන ලදී. මෙම මූලාරම්භය යටතේ, ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රකාශන 08 කට ආසන්න සංඛ්‍යාවක් නිකුත් කර ඇති අතර, පේටන්ට් බලපත්‍ර අයදුම්පතක් ඉදිරිපත් කර ඇත. ඊට අමතරව, පහතින් දක්වා ඇති ඒවා ද ඇතුළත්ව ප්‍රධාන තාක්ෂණික නිමැවුම් කිහිපයක් දැනට අවසන් කරමින් පවතී ,

- වාණිජ මිරිස් වගාව සඳහා සුදුසු ජෛව පොහොර.
- ප්ලාස්ටික් සහ ඉදිකිරීම් කර්මාන්ත අපද්‍රව්‍ය භාවිතා කරමින් කොන්ක්‍රීට් කුට්ටි නිෂ්පාදනය.

  - **ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ සහ වැඩමුළු වැඩසටහන් 2024 ක්‍රියාත්මක කිරීම - පළමු අදියර**

මෙම වැඩසටහන සඳහා පර්යේෂණ සහ වැඩමුළු යෝජනා කැඳවීම 2024 වසරේ තුන්වන කාර්තුවේ දී සිදුකළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පර්යේෂණ යෝජනා 430 ක් සහ වැඩමුළු යෝජනා 208 ක් ලැබී ඇත. මෙම යෝජනා ඇගයීමට ලක් කර පර්යේෂණ යෝජනා 16 ක් සහ වැඩමුළු යෝජනා 22 ක් තෝරා ගන්නා ලදී. මෙම පර්යේෂණ ව්‍යාපෘති සහ වැඩමුළු ආරම්භ කිරීම 2026 වර්ෂයේදී සිදුවනු ඇති අතර එය ඉන්දියාවේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුවේ එකඟතාවයට යටත්ව සිදු කෙරේ.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් එළැඹී ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, සහයෝගිතා වැඩසටහන් සඳහා අත්සන් තබන ලදී.

- 5 වන සහයෝගීතා වැඩසටහන යටතේ, 2025 වසර සඳහා විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන වෙතින් පර්යේෂණ ව්‍යාපෘති සහ වැඩමුළු සඳහා ඒකාබද්ධ යෝජනා කැඳවන ලදී.

- 2026 සහ 2027 වර්ෂයන්හිදී ක්‍රියාත්මක කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති යෝජනා 16 ක් සහ වැඩමුළු යෝජනා 22 ක් තෝරා ගන්නා ලදී.

- **දැනටමත් අත්සන් කර ඇති ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් (MoU) සහ මූලාරම්භයන්**
  - විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන සහයෝගිතාව පිළිබඳ ශ්‍රී ලංකාව සහ චීනය අතර අවබෝධතා ගිවිසුම

2025 ජුනි 10 වන දින චීනයේ චෙන්ග්ඩු හි දී, ශ්‍රී ලංකාව සහ චීනය අතර විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සහයෝගිතාව පිළිබඳ නව අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබිණි. ශ්‍රී ලංකාව විසින් මෙම අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා සිව් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර ඇති අතර ඒ පිළිබඳව චීනයට දැනුම් දෙන ලෙස විදේශ කටයුතු අමාත්‍යාංශයට දන්වා ඇත. විද්‍යා හා තාක්ෂණ සහයෝගිතාව සඳහා වන ඒකාබද්ධ කමිටුව කැඳවීමට චීනය සූදානමින් සිටින අතර, එහි පළමු රැස්වීම 2026 වසරේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

චීන පාර්ශවයෙන් යෝජිත ව්‍යාපෘති

i. Belt and Road සංකල්පය යටතේ සුහුරු කාර්ය සම්පාදන සහ සැපයුම් දාමය පිළිබඳ ඒකාබද්ධ රසායනාගාරය

චීනය විසින් ශ්‍රී ලංකාවේ සුහුරු කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ ඒකාබද්ධ පර්යේෂණාගාරයක් පිහිටුවීමට යෝජනා කරන ලද අතර එය වුහාන් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ප්‍රධානත්වයෙන් ACCIMT ආයතනය සහ මොරටුව විශ්වවිද්‍යාලයේ සහභාගීත්වයෙන් සිදු කිරීමට නියමිතය. එම ආයතන දෙකම මේ සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට එකඟත්වය පළ කර ඇත.

ii. ජෛව තාක්ෂණය සහ සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ කාර්මික සහයෝගිතාව

චීන වෛද්‍ය මධ්‍යස්ථානය (CMC) සහ SLIBTEC ආයතනය අතර සහයෝගිතාවයක් යෝජනා කරන ලද අතර, ඒ යටතේ ඒකාබද්ධ පර්යේෂණ, කාර්ය මණ්ඩල හුවමාරු, CMC හි ජෛව තාක්ෂණ වාණිජකරණ වේදිකා වෙත ප්‍රවේශය, ජෛව ඖෂධ නිෂ්පාදනය සම්බන්ධව තාක්ෂණ හුවමාරුව, ව්‍යාපාර ආරම්භයන් සඳහා සහාය, මූල්‍ය සේවා සහ ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ප්‍රවේශය යන ක්ෂේත්‍ර ආවරණය වනු ඇත.

iii. සිචුවාන් කෘෂිකාර්මික විශ්වවිද්‍යාලය සමඟ කෘෂිකර්ම සහයෝගිතාව

සිචුවාන් කෘෂිකාර්මික විශ්වවිද්‍යාලය විසින් , අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සහ විශ්වවිද්‍යාල සමඟ පර්යේෂණ සහයෝගිතාව, කෘෂිකාර්මික තාක්ෂණය සහ කාර්මික වැඩිදියුණු කිරීම, කුසලතා පුහුණුව සහ විද්වතුන් හුවමාරු වැඩසටහන් සඳහා සහයෝගිතාවක් යෝජනා කරන ලදී.

iv. ජංගම විද්‍යා හා තාක්ෂණ කෞතුකාගාරය

චීන ස්වභාවික විද්‍යා කෞතුකාගාර සංගමය, belt and road මූලාරම්භය යටතේ ශ්‍රී ලංකාවේ ජංගම විද්‍යා කෞතුකාගාරයක් සඳහා පහසුකම් සැලසීමට යෝජනා කර ඇත. දැනටමත් රටවල් කිහිපයක් සඳහා අනුමැතිය ලැබී ඇති තුන් අවුරුදු 'ජාත්‍යන්තර චීන ජංගම කෞතුකාගාර සංචාර' සඳහා ශ්‍රී ලංකාව ඇතුළත් කිරීමට චීනය එකඟ විය.

v. ගුයිෂෝ විශ්වවිද්‍යාලය (Guizhou University) සමඟ සහයෝගිතාවය

ගුයිෂෝ විශ්ව විද්‍යාලය තේ ක්ෂේත්‍රය හා විශේෂිතව ශ්‍රී ලාංකික ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට කැමැත්ත පළ කර තිබේ.

- ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් තායිලන්ඩ් (Asian Institute of Thailand) සමඟ යෝජිත අවබෝධතා ගිවිසුම

දැනට ක්‍රියාත්මක අවබෝධතා ගිවිසුම යටතේ තායිලන්තයේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ආයතන අතර සහයෝගිතාවය ශක්තිමත් කිරීම සඳහා තායිලන්තයෙන් ඉල්ලීමක් කරන ලදී. ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් තායිලන්ඩ් (AIT) විසින් පර්යේෂණ පාදක පශ්චාත් උපාධි වැඩසටහන් පිරිනැමීම සඳහා අමාත්‍යාංශය සමඟ සහයෝගිතාවයක් යෝජනා කර ඇති අතර, කෙටුම්පත් අවබෝධතා ගිවිසුම දැනට නීතිමය අනුකූලතා සමාලෝචනය යටතේ පවතී.

- TÜBİTAK Turkey Marmara පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ යෝජිත අවබෝධතා ගිවිසුම

ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාව සඳහා වූ ශ්‍රී ලංකා-තුර්කි ඒකාබද්ධ කොමිසමේ 3 වන සැසිවාරයෙන් පසුව, ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සහ TÜBİTAK අතර සහයෝගිතාවක් ස්ථාපනය සඳහා එකඟත්වය පළ විය. නිල මාර්ග හරහා ශ්‍රී ලංකාව මේ සඳහා සිය කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර, නිල නොවන මට්ටමින් අතථ්‍ය රැස්වීමක් පවත්වා සමාලෝචනය සඳහා කෙටුම්පත් අවබෝධතා ගිවිසුමක් බෙදා ගන්නා ලදී.

- ACCIMT ආයතනය සහ ඇමරිකා එක්සත් ජනපදයේ මේසන් විශ්වවිද්‍යාලය (Mason University, USA) අතර යෝජිත අවබෝධතා ගිවිසුම

ගිවිසුම් කෙටුම්පත නීතිමය අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කොට ඇත.අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් පසු, ACCIMT ආයතනය සහ ඇමරිකා එක්සත් ජනපදයේ මේසන්ස් නවෝත්පාදන රසායනාගාරය විසින්, 5G, සයිබර් ආරක්ෂාව සහ UAV සහ අනෙකුත් අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍රවල දෙපාර්ශ්වයම සඳහා ප්‍රතිලාභ අත්කරදීමට සමත් පර්යේෂණ අවස්ථා සෙවීමට අපේක්ෂා කෙරේ.

- පකිස්ථානය සමඟ අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා-පකිස්ථාන ඒකාබද්ධ ආර්ථික කොමිසමේ (JEC) 13 වන සැසිවාරයේදී, ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවලට අනුව, NIFS සහ SLIBTEC ආයතන සමඟ සහයෝගිතාවයෙන් කටයුතු කිරීමට පකිස්ථාන පාර්ශවයේ එකඟත්වය පළ විය.

- දකුණු අප්‍රිකාව සමඟ අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම

පළමු ඒකාබද්ධ කමිටු රැස්වීම අතථ්‍ය ආකාරයෙන් පවත්වන ලද අතර තාක්ෂණික රැස්වීම් කිහිපයක්ම අතථ්‍ය ආකාරයෙන් පවත්වන ලදී. 2026 වසරේ දී ශ්‍රී ලංකාව සත්කාරක රට ලෙස ක්‍රියාත්මක වෙමින් 2 වන ඒකාබද්ධ කමිටු රැස්වීම භෞතික රැස්වීමක් ලෙස කැඳවීමට යෝජනා කෙරේ.

- ඕස්ට්‍රේලියාව සමඟ සහයෝගිතාවය

ඕස්ට්‍රේලියානු ප්‍රතිපත්ති හා විද්‍යා ආයතනය (AIPS) සහ NASTEC ආයතනය අතර සහයෝගිතාවයක් ආරම්භ කිරීම සඳහා 2024 ඔක්තෝබර් මාසයේ දී විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සංකල්ප සටහනක් ඉදිරිපත් කරන ලදී. ඊට අමතරව, තාක්ෂණික සහාය ඉල්ලා NIFS විසින් ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය (ACIAR) වෙත යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. මේවා සහ අදාළ යෝජනා, කාර්තුමය ඒකාබද්ධ කොමිෂන් සභා රැස්වීම්වල දී සලකා බැලීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සමඟ සහයෝගිතාවන් ඇති කර ගැනීම සම්බන්ධව සාකච්ඡා කිරීමට ඕස්ට්‍රේලියානු-ශ්‍රී ලංකා ව්‍යාපාරික සංසදය ද කැමැත්ත පළ කර ඇත.

- කියුබාව සමඟ යෝජිත අවබෝධතා ගිවිසුම

ගිවිසුමේ කෙටුම්පත විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය/ එකඟතාවය සඳහා යවා ඇත.

- වියට්නාමය සමඟ යෝජිත අවබෝධතා ගිවිසුම

අවබෝධතා ගිවිසුමේ කෙටුම්පත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා වියට්නාමයේ එකඟතාවය ලබාගැනීම සඳහා යවා ඇත.

- දකුණු කොරියාව සමඟ සහයෝගිතාවය

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) සහ කාර්මික තාක්ෂණ ආයතනය (ITI) එක්ව දකුණු කොරියාව වෙත ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල තිරිවානා සහ සිලිකා වැලිවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියක් ඇතුළුව ව්‍යාපෘති යෝජනා දෙකක් ඉදිරිපත් කළ අතර, ඒ සඳහා අරමුදල් සපයාදීම සඳහා අනුමැතිය ලැබී ඇත. කොරියානු නව නිපැයුම් ප්‍රවර්ධන සංගමය (KIPA) සහ කොරියානු සෙරමික් ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (KICET) සමඟ අවබෝධතා ගිවිසුම් දෙකක් සැලසුම් කර ඇති අතර, අවශ්‍යවන අනුකූලතා අනුමැතීන් සහ කැබිනට් අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියෙහි අමාත්‍යාංශය නිරතව සිටී. මෙයට අමතරව මෙම වසරේ දී, යෝජනා සඳහා නව කැඳවීමක් සිදු කරනු ලැබූ අතර, ඒ සඳහා මොරටුව විශ්වවිද්‍යාලය විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇත.

- චීනයේ ජාතික නවෝත්පාදන විශිෂ්ටත්ව මධ්‍යස්ථානය (NICE) සමඟ සහයෝගිතාවය

චීනයේ ජාතික නවෝත්පාදන විශිෂ්ටත්ව මධ්‍යස්ථානයෙහි (NICE) අධ්‍යක්ෂවරයා ශ්‍රී ලංකාවට පැමිණි අතර අමාත්‍යාංශය යටතේ ඇති පර්යේෂණ ආයතන කිහිපයක් සමඟ සාකච්ඡාවක් පැවැත්විණි. NICE ආයතනය විසින් අවබෝධතා ගිවිසුමක් යෝජනා කරනු ලැබ ඇති අතර විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුකූලතා සමාලෝචනය යටතේ පවතී. NICE ආයතනය ශ්‍රී ලාංකික ආයතන වෙතින් යෝජනා කැඳවා ඇත.

➢ **පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා පහසුකම් සැපයීම**

රට තුළ සිදු කරනු ලබන සියලුම පර්යේෂණ ඇසුරෙන් දත්ත ක්‍රමානුකූලව රැස් කිරීම, එම දත්තවල ආරක්ෂාව සහතික කිරීම, එවැනි පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම සහ පර්යේෂණ සොයාගැනීම් සඳහා සාර්ථක වෙළඳපොළක් නිර්මාණය කිරීම මෙම වැඩසටහනේ අරමුණු අතර වේ.

- **රජය විසින් අරමුදල් සපයනු ලබන පර්යේෂණ කළමනාකරණය කිරීම සඳහා ජාතික පර්යේෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (NRMIS) ස්ථාපිත කිරීම ආරම්භ කිරීම**

මහජන අරමුදල් යොදා ගනිමින් සිදු කරනු ලබන පර්යේෂණ පිළිබඳ තොරතුරු සුපරීක්ෂණය, කළමනාකරණය සහ බෙදා හැරීම සඳහා මධ්‍යගත තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය සපුරාලනු පිණිස, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ සහාය ඇතිව ජාතික පර්යේෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියක් (NRMIS) සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස, පර්යේෂණ ප්‍රදාන ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය සඳහා වන තොරතුරු පද්ධතියේ මූලාකෘතිය දැනට වැඩිදියුණු කෙරෙමින් පවතී.

- **කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 අනුව පර්යේෂණ දීමනා ගෙවීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති සමාලෝචනය කිරීම සහ ඒ හා අදාළ ක්‍රියාකාරකම්**

මෙම චක්‍රලේඛය යටතේ, පර්යේෂණ අධීක්ෂණ කමිටුවේ සභාපතිත්වය දරනුයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසිනි. කමිටු සාකච්ඡා සංවිධානය කිරීමේ සහ පර්යේෂණ කළමනාකරණ කමිටුවල කාර්යයන් අධ්‍යයනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත; ඒ අනුව, වසර අවසන් වන විට, පර්යේෂණ යෝජනා/ ව්‍යාපෘති 23 ක් ඇගයීමට ලක් කර සෞඛ්‍ය අංශයේ පර්යේෂණ ඇගයීම සඳහා පර්යේෂණ කළමනාකරණ කමිටුවක් පත් කර ඇත.

- **පර්යේෂණ ආයතන විසින් පවත්වනු ලබන පර්යේෂණ අධීක්ෂණය, ඇගයීම සහ පහසුකම් සැපයීම**

2024 වසරේ දී, අමාත්‍යාංශය විසින්, ඒ හා අනුබද්ධිත පර්යේෂණ ආයතනවල 2025 වාර්ෂික පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කළ අතර ඉන් අනතුරුව පර්යේෂණ යෝජනා කැඳවීම සිදු කරන ලදී. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටළු විසඳීම, පර්යේෂණ උපකරණ සහ රසායනික ද්‍රව්‍ය සම්බන්ධ රේගු නිෂ්කාශන කඩිනම් කිරීම සඳහා පියවර නිර්දේශ කිරීම සහ තේ කර්මාන්තය සහ දේශීය වෛද්‍ය අංශය සමඟ හවුල්කාරිත්වයන් ඇතුළුව අන්තර්- අමාත්‍යාංශ පර්යේෂණ සහයෝගීතා සහ පාර්ශවකරුවන් විසින් මෙහෙයවනු ලබන පර්යේෂණ සහයෝගීතා ආරම්භ කිරීම හරහා, අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසා දෙන ලදී.

- **බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල්හි බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාවය සඳහා වන මූලාරම්භය (BIMSTEC)**

BIMSTEC යනු බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හතෙන් සමන්විත කලාපීය සංවිධානයකි. එය හරහා වෙළඳාම, තාක්ෂණය, බලශක්තිය, කෘෂිකර්මාන්තය, මහජන සෞඛ්‍යය සහ දේශගුණික විපර්යාස ඇතුළු බහුවිධ අංශ හරහා සහයෝගීතාව ප්‍රවර්ධනය කෙරේ. විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන අංශය සඳහා ප්‍රමුඛ රට ලෙස ශ්‍රී ලංකාව කටයුතු කරයි.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම (NASTEC) හා සහයෝගීතාවයෙන් ප්‍රධාන කාර්යයන් 2 ක් සම්බන්ධීකරණය කරනු ලැබිණි.

- BIMSTEC යටතේ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන උප අංශය
- BIMSTEC තාක්ෂණ හුවමාරු පහසුකම (BIMSTEC TTF) ස්ථාපිත කිරීම

2025 වසරේ දී, අමාත්‍යාංශය විසින් "දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ආහාර සුරක්ෂිතතාව ආමන්ත්‍රණය කිරීම, දේශගුණික විපර්යාසයන්ට එරෙහිව සටන් කිරීම සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම" යන මාතෘකාව යටතේ පළමු ආරම්භක කඳවුර ජනවාරි 29 වන දින සංවිධානය කරන ලදී. විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන සහයෝගීතාව පිළිබඳ BIMSTEC විශේෂඥ කණ්ඩායමේ 3 වන රැස්වීම අගෝස්තු 5-6 දිනවල කොළඹ දී, භෞතික සහ අතත්‍ය යන දෙයාකාරයෙන් පැවැත්විණි. BIMSTEC මහලේකම්වරයා සහ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා

සහ ලේකම්වරයා සමඟ රැස්වීම් පෙබරවාරි 6 සහ ජූනි 19 යන දිනවල පවත්වන ලදී. මෙයට අමතරව, BIMSTEC තාක්ෂණ හුවමාරු පහසුකම (BIMSTEC TTF) සඳහා සත්කාරක රට සම්බන්ධ ගිවිසුමෙහි කෙටුම්පත සාමාජික රටවල් අතර ප්‍රතිපෝෂණයන් ලබා ගනු පිණිස බෙදා හරින ලදී.

- **ඉන්දියානු සාගර තීරය ආශ්‍රිත රටවල්හි සංගමය (IORA) යටතේ විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම**

ශ්‍රී ලංකාව, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය හරහා, සාමාජික රටවල් 23 ක් සහ සංවාද හවුල්කරුවන් 10 දෙනෙකුගෙන් සමන්විත කලාපීය ආයතනයක් වන ඉන්දියානු සාගර තීරය ආශ්‍රිත රටවල්හි සංගමය (IORA) යටතේ ක්‍රියාත්මක විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමට (WGSTI) සහභාගී වේ. WGSTI හි ක්‍රියාකාරී සැලැස්ම යටතේ, සමුද්‍ර පර්යේෂණ ව්‍යාපෘති දෙකක් පිලිබඳ වගකීම ශ්‍රී ලංකාව වෙත පැවරී ඇති අතර, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතනය (NARA) සහ සාගර විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතාවයෙන් විශේෂ IORA අරමුදල් සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත. "Seagrass Blue Economy for Sustainability of Small-Scale Fisheries and Global Blue Carbon Market through Community-Based Restoration and Conservation" යන NARA ආයතනයේ ප්‍රධානත්වයෙන් මෙහෙයවනු ලබන ව්‍යාපෘතිය අනුමත කරන ලද අතර, අනෙක් අරමුදල් අයදුම්පත IORA ලේකම් කාර්යාලය විසින් ඇගයීමට ලක් කෙරෙමින් පවතී.

- **නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය)**

ශ්‍රී ලංකාව සඳහා වන කේන්ද්‍රීය ලක්ෂ්‍යය ලෙස NASTEC හි සහාය ඇතිව වැඩසටහන් සම්බන්ධීකරණය කරනු ලැබේ.

අමාත්‍යාංශය විසින් ඒ යටතේ ක්‍රියාත්මක පර්යේෂණ ආයතන, රාජ්‍ය විශ්වවිද්‍යාල සහ අනෙකුත් පර්යේෂණ සහ සංවර්ධන ආයතන අතර සහයෝගීතාවන් වර්ධනය කිරීමට පියවර ගනු ලැබ ඇත. අලි-මිනිස් ගැටුම් සහ අලි-දුම්රිය ගැටුම් සඳහා විසඳුම් ලබා දීමේ අරමුණින්, පරිසර අමාත්‍යාංශය සහ දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතාවයක් ස්ථාපනය කර ගනු ලැබූ අතර, දේශීය නව නිපැයුම් 18 ක් අතුරින් ක්‍රියාත්මක කිරීම සඳහා දෙකක් තෝරා ගනු ලැබිණි. කෘෂිකාර්මික පාඩු අවම කිරීම සහ අවම කිරීමේ ශිල්පීය ක්‍රම කෙරෙහි අවධානය යොමු වූ අතර ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශ කිහිපයක් සමඟ සාකච්ඡාවන් පවත්වන ලදී. විශ්වවිද්‍යාල-පර්යේෂණ ආයතන සහයෝගීතාවය ශක්තිමත් කිරීම සඳහා, තාක්ෂණ සූදානම් මට්ටම (TRL) අනුව ඇගයීමට ලක් කරන ලද පර්යේෂණ යෝජනා ඉදිරිපත් කරන ලෙසට තාක්ෂණ, කෘෂිකර්ම, විද්‍යා, වෛද්‍ය විද්‍යා සහ ඉංජිනේරු පීඨවලට ආරාධනා කරන ලද අතර එම පර්යේෂණ යෝජනා ඒකාබද්ධව වැඩිදියුණු කිරීම සඳහා ස්ථිර වේදිකාවක් ස්ථාපිත කර ඇත. මෙයට අමතරව, NERD මධ්‍යස්ථානයේ මෙහෙයවීම යටතේ අමාත්‍යාංශය විසින් විකල්ප ඉදිකිරීම් ද්‍රව්‍ය, ක්‍රම සහ සැලසුම් පිළිබඳ සොයාබැලීම සඳහා රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදි.

➢ රොබෝ විද්‍යා යෙදවුම් පිළිබඳ විශිෂ්ටතා මධ්‍යස්ථානය (CERA)

CERA ව්‍යාපෘතිය යළි පණ ගැන්වීමේ අරමුණින්, ජාතික සංවර්ධනය සඳහා මෙම පහසුකම භාවිතා කළ හැකි ආකාරය සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කරන ලදී. CERA ක්‍රියාත්මක කිරීම සඳහා කමිටුවේ යෝජිත මාර්ග සිතියම මත පදනම්ව, ව්‍යාපෘතිය පූර්ණ මෙහෙයුම් තත්ත්වයට ගෙන ඒම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) සමඟ සහයෝගීතාවයෙන් ක්ෂණික අරමුදල් වෙන් කර ඇත.

➢ උපයෝගිතා සේවා වෙන් කිරීම: SLINTEC සහ SLIBTEC

SLINTEC සහ SLIBTEC හි අනාගත උපායමාර්ගික දිශානතිය පරීක්ෂා කිරීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවක් ස්ථාපනය කරන ලදී. මෙම කමිටුවේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසුව, යෝජිත ව්‍යුහාත්මක වෙනස්කම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා ආරම්භ කර ඇත.

➢ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම්

- **නව පර්යේෂණ මාර්ග සිතියමක් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා ජාතික පර්යේෂණ ආයෝජන රාමුව තුළ සිදුකළ මැදිහත්වීම්.**

ප්‍රධාන ජාතික ක්ෂේත්‍රයන්හි සිදු කෙරෙන පර්යේෂණ සඳහා උපායමාර්ගික මඟ පෙන්වීම සහ සම්බන්ධීකරණය සපයනු පිණිස ජාතික පර්යේෂණ මාර්ග සිතියමක් සංවර්ධනය කිරීම සඳහා මූලික පියවර ගන්නා ලදී. විද්‍යාව, තාක්ෂණය සහ පර්යේෂණ සංවර්ධනය සඳහා දායකත්වය දක්වනු පිණිස විශේෂඥයින් 190 කට අධික සංඛ්‍යාවකින් සමන්විත වේදිකාවක් ස්ථාපිත කර ඇත. ආචාර ධර්ම, පාලනය සහ පර්යේෂණ අඛණ්ඩතාව සඳහා ජාතික මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම මෙන්ම ජාතික පර්යේෂණ සභාව (NRC) සහ ජාතික විද්‍යා පදනම (NSF) සමඟ සහයෝගිතාවයෙන් පර්යේෂණ සඳහා පොදු ඇගයීම් ක්‍රමවේදයක් නිර්මාණය කිරීම පිළිබඳ කටයුතු ආරම්භ කර ඇත. ඇගයුම්කරුවන්ගේ ගෙවීම් සඳහා වන මාර්ගෝපදේශ ද සකස් කෙරෙමින් පවතී.

- **"විද්‍යා" ඊ-නිවිස් වෙබ් අඩවිය හරහා මහජනතාව අතර නවීන විද්‍යාවන් පිළිබඳ දැනුම හා භාවිතය ප්‍රවර්ධනය කිරීම.**

2022 වසරේදී භාෂා ත්‍රිත්වයෙන්ම දියත් කරන ලද විද්‍යා ඊ-නිවිස් වෙබ් අඩවිය (www.vidyaenews.most.gov.lk) මඟින් කෘත්‍රිම බුද්ධිය (AI), අතථ්‍ය යථාර්ථය (VR), තාරකා විද්‍යාව, ක්ලවුඩ් පරිගණකකරණය, නැනෝ තාක්ෂණය, රොබෝ විද්‍යාව, 3D මුද්‍රණය සහ ජීව විද්‍යාත්මක හා ස්වාභාවික විද්‍යාව වැනි ක්ෂේත්‍ර පිළිබඳ විද්වත් ලිපි බෙදා හරිනු ලැබේ. 2025 වසර අවසානය වන විට 80 ඉක්මවූ ලිපි සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් කර ඇත. ෆේස්බුක් සහ යූ ටියුබ් හරහා ද දැනුම බෙදා ගැනෙන අතර, වාර්ෂිකව පවත්වනු ලබන විද්‍යා ඊ-නිවිස් ලිපි තරඟාවලිය හරහා සිසුන් සහ මහජනතාව සම්බන්ධ කර ගැනේ. 2025 ජාතික විද්‍යා දිනයේ දී දියත් කරන ලද විශේෂ විද්‍යා ඊ-සඟරාවේ ජයග්‍රාහී ලිපි පල කර ඇත.

- **ජාතික පර්යේෂණ ආයෝජන රාමුවේ එක් එක් ප්‍රධාන ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.**

2025 වසරේ දී, අමාත්‍යාංශ නිලධාරීන් සහ ස්වේච්ඡා විද්‍යා සන්නිවේදකයින් පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි ප්‍රතිලාභ පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වූයේ විද්‍යා සන්නිවේදන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සහ විද්‍යාව ප්‍රජාව වෙත රැගෙන යාම සඳහා ජාතික මාර්ග සිතියමක් සකස් කිරීමට සහාය වීමයි.

- **පර්යේෂණ සහ සංවර්ධන (R&D) ප්‍රතිපත්තිය**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC) විසින් කෙටුම්පත් කරන ලද පර්යේෂණ සහ සංවර්ධන (R&D) ප්‍රතිපත්තිය, ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ සහයෝගිතාවයෙන් සංවිධානය කරන ලද පාර්ශ්වකරුවන්ගේ උපදේශන රැස්වීම් හතරක දී සාකච්ඡාවට භාජනය විය. මෙම

උපදේශනවලින් පසුව, කෙටුම්පත් කරන ලද ප්‍රතිපත්තිය වැඩිදුර ක්‍රියාමාර්ග සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව (NPD) වෙත යොමු කරන ලදී.

- **ජාතික අභ්‍යවකාශ ප්‍රතිපත්තිය**

ජාතික ආරක්ෂාව, තිරසර සංවර්ධනය සහ ආර්ථික වර්ධනය සඳහා අභ්‍යවකාශ විද්‍යාවේ සහ තාක්ෂණයේ උපායමාර්ගික කාර්යභාරය හඳුනා ගනිමින්, අමාත්‍යාංශය ජාතික අභ්‍යවකාශ ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම ආරම්භ කර ඇත. විශේෂඥයින් සහ පාර්ශ්වකරුවන් සමඟ එක්ව සංවර්ධනය කරන ලද මෙම ප්‍රතිපත්තිය ආපදා කළමනාකරණය, දේශගුණික නිරීක්ෂණ, කෘෂිකර්මාන්තය, සමුද්‍රීය ආරක්ෂාව සහ විදුලි සංදේශ යන ක්ෂේත්‍රවල යෙදීම් සඳහා සහාය වෙමින්, ශ්‍රී ලංකාවේ අභ්‍යවකාශ ක්ෂේත්‍රයේ සමායෝජිත සහ තිරසර වර්ධනය සහතික කිරීම අරමුණු කරයි.

➢ ජාතික තත්ත්ව යටිතල පහසුකම් (NQI) පද්ධති ශක්තිමත් කිරීම

"ජාතික තත්ත්ව යටිතල පහසුකම් (NQI) පද්ධති ශක්තිමත් කිරීම" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කළ 2025 ජාතික අයවැය යෝජනාවට අනුකූලව, වත්මන් මූල්‍ය වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට රුපියල් මිලියන 750 ක ප්‍රතිපාදනයක් ලබා දෙන ලදී.

ඒ අනුව, අමාත්‍යාංශය විසින් අදාළ ආයතන වෙතින් ව්‍යාපෘති යෝජනා කැඳවනු ලැබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් මිලියන 742 ක මුළු වියදමක් යටතේ ව්‍යාපෘති 27 ක් අනුමත කර අරමුදල් සපයන ලදී. ජාතික තත්ත්ව යටිතල රාමුවේ (NQI) ස්ථර පහම ආවරණය වන පරිදි මෙම යෝජනා ඉදිරිපත් විය. සාක්ෂි මත පදනම් වූ නියාමනය සඳහා ව්‍යුහගත සහ ක්‍රමානුකූල ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට හඳුන්වා දුන් නියාමන බලපෑම් තක්සේරුව (RIA) ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම කෙරෙහි ද මෙම ව්‍යාපෘතිය යටතේ විශේෂ අවධානයක් යොමු කෙරිණි.

සාමූහිකව ගත් කල, මෙම මූලාරම්භයන් ශ්‍රී ලංකාවේ ජාතික තත්ත්ව යටිතල රාමුව ශක්තිමත් කිරීම සම්බන්ධව සැලකිය යුතු ප්‍රගතියක් ප්‍රදර්ශනය කරන අතරම, ආර්ථිකයේ විවිධ අංශයන්හී රාජ්‍ය යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම, නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම සහ තත්ත්ව සහතිකකරණය සවිමත් කිරීම සිදු කරයි.

➢ ශ්‍රී ලංකා නිනිතිතාක්ෂණ ආයතනය (SLINTEC)

- **මෙහෙවර හා බැඳුණු පර්යේෂණ**

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ බාහිර අරමුදල් ඇසුරෙන් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතීන්හි වත්මන් තත්ත්වය පහතින් දක්වා ඇත.

ව්‍යාපෘති නාමය	අරමුදල් සපයන ආයතනය	ව්‍යාපෘතිය සඳහා වැයවන වියදම (රු.මි.)	වත්මන් තත්ත්වය
දේශීය			
කර්මාන්ත අංශයේ යෙදීම් සඳහා කොහු කෙඳි වලින් නිස්සාරණය කරන ලද ලිග්නින් ඩයි	කර්මාන්ත අංශය	10	කර්මාන්ත අංශය සඳහා සුදුසු රෙදි සායම් කිරීමේ ක්‍රියාපටිපාටියක් සංවර්ධනය කිරීම සඳහා 2022 දී දියත් කරන ලද ලිග්නින් මත පදනම් වූ ස්වාභාවික සායම් ව්‍යාපෘතිය මේ වනවිට සම්පූර්ණ කර ඇති අතර තාක්ෂණය පවරාදීම සඳහා සිදුකෙරෙන සාකච්ඡා අවසන් අදියරේ පවතී
රෙදිපිළි යෙදුම් සඳහා ස්වභාවික ඩයි වර්ග ක්ෂුද්‍ර - ජීවී	කර්මාන්ත අංශය	25	2023 දී දියත් කරන ලද රෙදිපිළි සඳහා ලොව ප්‍රථම දිලීර-ව්‍යුත්පන්න ස්වභාවික ඩයි ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇති අතර තාක්ෂණය පවරාදීම සඳහා සිදුකෙරෙන සාකච්ඡා අවසන් අදියරේ පවතී
තෝරාගත් යෙදුම් සඳහා සංවේදක ද්‍රව්‍ය සංවර්ධනය කිරීම	විදේශීය /දේශීය	10	දැනට සිදුකෙරෙමින් පවතී
මෙහෙවර පදනම් කරගත් කාණ්ඩය යටතේ ව්‍යාපෘති යෝජනා දහයක් සඳහා 2025 ක්‍රියාකාරී සැලැස්ම හරහා අයවැය අනුමත කෙරේ	ශ්‍රී ලංකා රජය	100	දැනට සිදුකෙරෙමින් පවතී
සමුද්‍ර පරිසරයේ යෙදීම් සඳහා සාම්ප්‍රදායික ආලේපනයන්හි ප්‍රති-විබාදන ගුණ වැඩි දියුණු කිරීම	කර්මාන්ත අංශය	10	දැනට සිදුකෙරෙමින් පවතී
කාබන් ග්‍රහණය සහ දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා නැනෝ-ජෛව තාක්ෂණික මෙවලම් සංවර්ධනය කිරීම	කර්මාන්ත අංශය	10	දැනට සිදුකෙරෙමින් පවතී
කාර්මික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සහ තක්සේරුකරණය	කර්මාන්ත අංශය	5	දැනට සිදුකෙරෙමින් පවතී

කාර්මික යෙදීම් සඳහා නව අණු සොයා ගැනීම	කර්මාන්ත අංශය	10	දැනට සිදුකෙරෙමින් පවතී
කාර්මික යෙදුම් සඳහා නැනෝ-ජෛව ද්‍රව්‍ය සංවර්ධනය කිරීම.	කර්මාන්ත අංශය	5	දැනට සිදුකෙරෙමින් පවතී
රුධිරයේ සීනි නියාමනය කිරීමේ ක්‍රමයක් හඳුනා ගැනීම	කර්මාන්ත අංශය	5	දැනට සිදුකෙරෙමින් පවතී
සුදු හිසකෙස් ආවරණය සඳහා ශාක පදනම් කරගත් කළු හිසකෙස් සායම් වර්ගයක් සංවර්ධනය කිරීම	කර්මාන්ත අංශය	15	වාණිජකරණය කිරීමට සූදානම්ව ඇත.
ජාත්‍යන්තර			
ආර්ථික වශයෙන් අඩු සංවර්ධනයක් සහිත රටවල ආහාර සුරක්ෂිතතාව සහ තිරසර සංවර්ධනය යටපත් කිරීමේ හැකියාවක් කෘෂිකාර්මික ක්ෂුද්‍ර ප්ලාස්ටික් වලට පවතීද?	NERC/ GCRF	බ්‍රිතාන්‍ය පවුම් 96,329.02 (SLINTEC)	මෙම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කර ඇත.
ඉලෙක්ට්‍රොනික, වෛද්‍ය උපාංග, EV බැටරි, ජල පිරිපහදුව, කෘෂිකර්මය, ද්‍රව්‍ය විද්‍යාව සහ බලශක්ති ක්ෂේත්‍රයන්හි ග්‍රැෆීන් යෙදුම්	විදේශ/ අබුඩාබි විශ්වවිද්‍යාලය	50	දැනට සිදුකෙරෙමින් පවතී

- **ගිවිසුම්ගත පර්යේෂණ**

- **දුම්රිය තිරිංග කුට්ටි සඳහා බහු අවයවික සංයෝගයක් සංවර්ධනය කිරීම**

  දුම්රිය තිරිංග සපත්තු (තිරිංග කුට්ටි) සඳහා බහු අවයවික සංයෝගයක් සංවර්ධනය කිරීම සඳහා 2024 දී දියත් කරන ලද ව්‍යාපෘතියෙ හි පර්යේෂණ අදියර සම්පූර්ණ කර ඇති අතර මේ වන විට තාක්ෂණ පැවරුම් කණ්ඩායම වෙත ලබා දී ඇත.

- **කැල්සියම් කාබනේට් නවීකරණය කිරීම**

  කැල්සියම් කාබනේට් නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වර්ණක ශ්‍රේණියේ TiO_2 හා සැසඳිය හැකි ඉහළ වර්තනාංකයක් සහිතව $CaCO_3$ සංවර්ධනය කිරීමයි. අවසාන ව්‍යාපෘති සමාලෝචනය සහ තාක්ෂණය පවරාදීම පිළිබඳ සාකච්ඡා දැනට සිදුකෙරෙමින් පවතී.

- **ශාකසාර අතුරු නිෂ්පාදන වලින් ස්වාභාවික සායම් වර්ග නිපදවීම**

  දැනට ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශාකසාර කර්මාන්තයේ අතුරු නිෂ්පාදන ඇසුරෙන් ප්‍රශස්ත වර්ණ නිස්සාරණ පරාමිතීන් සහිත ස්වභාවික සායම් සංයෝගයක මූලාකෘතියක් නිර්මාණය කිරීමයි. මෙම සායම් සංයෝගය, සායම් ගැල්වීමේ සම්මත ක්‍රමවේදය අනුගමනය කරමින් 100% කපු රෙදි මත යෙදීම සඳහා නිර්මාණය කර ඇත. අවසාන ව්‍යාපෘති සමාලෝචනය සහ තාක්ෂණය පවරාදීම පිළිබඳ සාකච්ඡා දැනට සිදුකෙරෙමින් පවතී.

- **පරිරක්ෂණය සඳහා ලුණු දැමීමේදී ගර්භිණී වල හැපෙනසුළු බව නැතිව යාම පිළිබඳ විමර්ශනය.**

  පරිරක්ෂණය කිරීමේ ක්‍රියාවලියේදී ගර්භිණී වල හැපෙනසුළු බව නැතිවීමට හේතු වන සාධක හඳුනා ගැනීම අරමුණු කරගත් කෙටි කාලීන ව්‍යාපෘතියකි. අවසාන නිෂ්පාදනයේ අපේක්ෂිත හැපෙනසුළු බව ආරක්ෂා කර ගැනීම සඳහා පියවර නිර්දේශ කිරීම උදෙසා විවිධ ලුණු සාන්ද්‍රණයන්, pH මට්ටම් සහ පරිරක්ෂණය කිරීමේ තත්ත්වයන් යටතේ වයනයෙහි සිදුවන වෙනස්කම් විශ්ලේෂණය කිරීම කෙරෙහි ව්‍යාපෘතිය අවධානය යොමු විය.

- **සිමෙන්ති වර්ණය සහ සැකසුම් කාලය වැඩිදියුණු කිරීම**

  මෙම ව්‍යාපෘතිය යටතේ සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්තිවල වර්ණ තීව්‍රතාවය වැඩි දියුණු කිරීම සහ සැකසීමේ කාලය ප්‍රශස්ත කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ද්‍රව්‍ය හා ක්‍රියාවලි වෙනස් කිරීම් හරහා සැකසුම් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කරන අතරම තද පැහැයෙන් යුත්, වඩාත් ඒකාකාර නිමාවක් ලබා ගැනීම ව්‍යාපෘතියේ අරමුණ විය.

- **ජෙව ශාකසාර පෙති විශ්ලේෂණය**

  ජෙව ශාකසාර පෙත්තක කාර්යක්ෂමතාව තක්සේරු කිරීම සඳහා එය විශ්ලේෂණයට ලක් කෙරෙන පුළුල් අධ්‍යයනයකි. මෙම ව්‍යාපෘතියට සවිස්තරාත්මක ක්‍රමවේදය, විශ්ලේෂණාත්මක පරීක්ෂණ සහ ප්‍රතිඵල අර්ථ නිරූපණය ඇතුළත් වූ අතර,මෙම ශාකසාර පෙත්තෙහි සමස්ත කාර්යක්ෂමතාව පිළිබඳ සොයාගැනීම් සහ නිගමන සාරාංශගත කරමින් සකසනු ලැබූ අවසාන වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

- **ඩයබිසෝල් ව්‍යාපෘතිය - ආහාර ගැනීමෙන් පසු රුධිරයේ ග්ලූකෝස් අඩු කිරීමේ කාර්යක්ෂමතාව ඇගයීම සහ අමුද්‍රව්‍ය වටිටෝරුව වැඩිදියුණු කිරීම**

  පරීක්ෂා කරන ලද සියලුම අමුද්‍රව්‍ය සඳහා α-ඇමයිලේස් නිෂේධන දත්ත ද ඇතුළත්ව ඩයබිසෝල් උසස් මෘදු ජෙල් කැප්සියුලවල ආහාර ගැනීමෙන් පසු ග්ලූකෝස් අඩු කිරීමේ කාර්යක්ෂමතාව විශ්ලේෂණය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. අවසාන වාර්තාවේ මෙම නිෂ්පාදනයේ වැඩිදියුණු කිරීම සඳහා සංයුති ගැලපීම් සහ නිර්දේශ ද දක්වා ඇත.

- **රෙදි සඳහා ස්වයං - ඇලවුම් රෙදි කැබලි වැඩිදියුණු කිරීම**

  රෙදිපිළි යෙදීම් සඳහා සුදුසු ඇලවුම් ගුණාංග සහිත සංයුක්ත ද්‍රව්‍ය හඳුනා ගැනීම සහ ප්‍රශස්ත කිරීම කෙරෙහි මෙම ව්‍යාපෘතිය යටතේ අවධානය යොමු කෙරේ. එයට ද්‍රව්‍ය අනුපාත සහ යෙදුම් ක්‍රම ප්‍රශස්ත කිරීම ඇතුළත් වූ අතර, කාන්තා උඩුකය ආවරණ සඳහා භාවිතා කරනු පිණිස මෙම සංවර්ධනය කරන ලද සංයුක්තයේ යාන්ත්‍රික ගුණාංග, නැවත භාවිතා කිරීමේ හැකියාව සහ යෝග්‍යතාවය ඇගයීමට ලක් කරන ලදී. මෙහි තෙවන අදියර පළඳින්නන්ගේ අත්හදා බැලීම් වලින් ලැබෙන ප්‍රතිපෝෂණ මත පදනම්ව සිදු කෙරෙනු ඇත.

- **සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ ආරම්භ කරන ලද ගිවිසුම් ගත ව්‍යාපෘති**

ව්‍යාපෘති නාමය	සේවාලාභියා	මුදල
දැනට ක්‍රියාත්මකව පවතින ගිවිසුම්ගත පර්යේෂණ		
පොල් චතුර ශක්තිජනක පානය	කර්මාන්ත අංශයේ හවුල්කරු	මුළු ව්‍යාපෘති පර්යේෂණ වටිනාකම ආසන්න වශයෙන් රු.මි. 15 කි
හයිඩ්‍රොපොනික් පද්ධති සඳහා ලාභදායී දියර පොහොර		
ශාක අපද්‍රව්‍ය වලින් තිරසර ස්වාභාවික සායම් සංවර්ධනය කිරීම		
ආහාර ශ්‍රේණියේ තීන්ත සංවර්ධනය		
ඇලවුම් සංයෝගයක් සංවර්ධනය කිරීම		
රෙදි ඇලවුම්කාරක සංවර්ධනය		
සෝඩියම් අයන බැටරි සඳහා ඉලෙක්ට්‍රෝඩ ද්‍රව්‍ය සංවර්ධනය කිරීම		

- **උපදේශන සහ විශ්ලේෂණ සේවා**

- බීම වර්ග, ඇඟලුම් හා අනෙකුත් අංශ ඇතුළු විවිධ අපනයන කර්මාන්ත සම්බන්ධයෙන් පැන නැඟ ඇති, රසායනික ද්‍රව්‍ය ඇසුරින් අපවිත්‍ර වීම් පිලිබඳ ගැටළු නිරාකරණය කිරීම සඳහා කුඩා පරිමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

- තේ සංඝටක විශ්ලේෂණ ව්‍යාපෘතිය - මුළු ආදායම වශයෙන් රු.මි. 12ක මුදලක් උපයා ගැනීමේ අපේක්ෂාවෙන් තේ සාම්පල 1,000ක් හරහා සංයෝග 23ක් විශ්ලේෂණය කිරීම සඳහා ගිවිසුමකට එළැඹ ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා සේවාදායකයා විසින් රු.මි. 5ක මූලික අත්තිකාරම් මුදලක් ගෙවා ඇත.

- ඖෂධ ආරක්ෂාව උදෙසා මූලිකත්වය ගැනීම: SLINTEC විසින් NMRA සමඟ ස්ථාපනය කර ගනු ලැබ ඇති හවුල්කාරිත්වය හේතුවෙන්, ඖෂධ ක්ෂේත්‍රය හරහා ප්‍රමාදයන් අවම කිරීම සහ ආරක්ෂාව හා තත්ත්ව ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සඳහා ඖෂධ පරීක්ෂණ විධිමත් කරනු ලබන අතර, නියාමන කාර්යක්ෂමතාව සහ විශ්ලේෂණ හැකියාවන් තවදුරටත් ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් දැනට සාකච්ඡාවන් සිදුකෙරෙමින් පවතී.

- **ප්‍රතීතන වැඩසටහන**

ඇෆ්ලැටොක්සින්, තැලේට් සහ පෝෂණ විශ්ලේෂණය ඇතුළු ජාත්‍යන්තරව පිළිගත් ආහාර සුරක්ෂිතතා පරීක්ෂණ ක්ෂේත්‍රයේ සිය නිපුණතාවය තහවුරු කරමින්, කෘෂි ආහාර අනුකූලතාව සහ අපනයන සඳහා සහාය වීම සඳහා 2025 ජුනි 9 වන දින ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) වෙතින් ISO/IEC 17025:2017 ප්‍රතීතනය ලබා ගැනීමට සිය උසස් විශ්ලේෂණ සේවා රසායනාගාරය සමත් වීමත් සමඟ SLINTEC විසින් ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කර ඇත.

ප්‍රතීතනයේ සවිස්තරාත්මක විෂය පථය පහත දැක්වේ.

අංක	**නිෂ්පාදනය /පරීක්ෂාවට ලක් කෙරෙන ද්‍රව්‍යය**	**සිදුකරන ලද නිශ්චිත පරීක්ෂණ**
01.	ආහාරයට ගත හැකි තෙල් සහ කුළුබඩු, ධාන්‍ය වර්ග සහ සත්ත්ව ආහාර	Aflatoxin B1 and G1
		Aflatoxin B2 and G2
		Total Aflatoxins
02.	මේද සහ ආහාරයට ගත හැකි තෙල්	Phthalates (DMP/ DEHP/ DBP/ DNOP Phthalates (DIDP/ DINP)
03.	බීම වර්ග	Phthalates (DMP/ DEHP/ DBP/ DNOP) Phthalates (DIDP/ DINP)
04.	කිරි සහ කිරි නිෂ්පාදන	ලුණු
		සමස්ත සීනි
05.	සීනි රසකැවිලි සහ කිරි නිෂ්පාදන	සමස්ත සීනි
	ධාන්‍ය වර්ග සහ බිස්කට්	
06.	සීනි රසකැවිලි	මේද
07.	ධාන්‍ය වර්ග සහ බිස්කට්	මේද

2025 විශ්ලේෂණ සේවාවන්	**සේවාදායකයින් සංඛ්‍යාව**	**ආදායම (රු.මිලියන)**
කර්මාන්ත, විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන	500	30

- **කාර්යසාධනය**

- **පර්යේෂණ සහ සංවර්ධන**

පර්යේෂණ ව්‍යාපෘති අටක් නිම කර ඇති අතර, දැනට හතක් වාණිජකරණය සඳහා සාකච්ඡා මට්ටමේ පවතී.

- **තාක්ෂණ පැවරුම්/වාණිජකරණය**

පහතින් දක්වා ඇති පරිදි SLINTEC ආයතනය නිෂ්පාදන වාණිජකරණය තුලින් රුපියල් මිලියන 94ක් උපයා ගෙන ඇත:

- ජලයේ ද්‍රාව්‍ය curcumin භාවිතයෙන් වයස්ගත වීම වැළැක්වීමේ serum
- ජලයෙන් තෙල් අවශෝෂණය සඳහා ග්‍රැෆයිට් පාදක ව්‍යුත්පන්නය

- **පේටන්ට්**

2024 වසරේ දී පේටන්ට් බලපත්‍ර හතරක් ගොනු කරන ලද අතර ඉන් එකක් ප්‍රදානය කරන ලදී. 2025 වසරේදී එක් පේටන්ට් බලපත්‍රයක් ගොනු කරන ලදී. සියලුම පේටන්ට් බලපත්‍ර ප්‍රධාන වශයෙන් දේශීයව ගොනු කරන ලද අතර, රෙදිපිළි, රූපලාවන්‍ය සහ ද්‍රව්‍ය විද්‍යාව යන ක්ෂේත්‍ර ඇතුළත් විය.

- **විද්‍යාව ප්‍රචලිත කිරීම**

ප්‍රචලිත කිරීමේ ක්‍රමය	**2024 (සංඛ්‍යාව)**			**2025 (සංඛ්‍යාව)**		
	ඉලක්කගත වැඩසටහන්	**සම්පූර්ණ කරනු ලැබූ**	**ප්‍රතිලාභීන්**	**ඉලක්කගත වැඩසටහන්**	**සම්පූර්ණ කරනු ලැබූ**	**ප්‍රතිලාභීන්**
පාසල් සහ විශ්වවිද්‍යාල චාරිකා	50	56	5000ට ආසන්න	50	54	5400ට ආසන්න
නැනෝ තාක්ෂණය සහ උසස් ගුණාංගීකරණය පිළිබඳ ව්‍යාත්තීය සංවර්ධන වැඩසටහන	3	3	75	3	2	50
උපකරණ පුහුණු වැඩසටහන්	-	-	-	1	1	50
සහභාගී වූ ප්‍රදර්ශන	3	3	6000	3	3	> 5000

- **විද්‍යාත්මක ප්‍රකාශන**

අංක	**වර්ගය**	**ප්‍රකාශන සංඛ්‍යාව**			
		2024		**2025**	
		ඉලක්කගත	**ප්‍රකාශිත**	**ඉලක්කගත**	**ප්‍රකාශිත**
1	පොත් සහ පොත් පරිච්ඡේද	15	12	15	2
2	ජර්නල ලිපි (සුවිගත)				
3	සාරාංශ (සම්මන්ත්‍රණ, රැස්වීම් කටයුතු)				
4	පුවත්පත් / සඟරා ලිපි	10	22	10	8

- **අනෙකුත් විශේෂ වැඩසටහන්**

1. SLINTECහි උසස් විශ්ලේෂණ සේවා රසායනාගාරය (AASL) විසින් ඇෆ්ලැටොක්සින් පරීක්ෂණ (B1, B2, G1, G2 සහ එකතුව), තැලේට් හඳුනාගැනීම (වර්ග 6) සහ Traffic Light පෝෂණ විශ්ලේෂණය (මේදය, ලුණු, සීනි සහ එකතුව) සිදු කිරීම සඳහා SLAB වෙතින් ISO/IEC 17025:2017 ප්‍රතීතනය ලබා ගැනීමට සමත්ව ඇත.

2. සැබෑ ලෝකයේ අභියෝග සහ පෙරළිකාර පර්යේෂණ විසඳුම් අතර පරතරය පියවා ගනිමින් ශ්‍රී ලාංකික කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම උදෙසා "Innovation Expo" යන නාමය යටතේ සංසද මාලාවක් දියත් කිරීමට SLINTEC ආයතනය විසින් පියවර ගනු ලැබිණි. සමාරම්භක කාර්මික සංසදය 2025 මාර්තු 25 වන දින බියගම ආයෝජන මණ්ඩල කලාපයේ දී පවත්වන ලද අතර, ඉන් අනතුරුව 2025 මැයි 22 වන දින කොග්ගල අපනයන සැකසුම් කලාපයේ දී තවත් සංසදයක් පවත්වන ලදී.

3. නැනෝ තාක්ෂණ දැනුම කේන්ද්‍රස්ථාන පාඨමාලා: SLINTEC ආයතනය විසින් 2025 මාර්තු සහ අගෝස්තු මාසවල දී නැනෝ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා දෙකක් පවත්වන ලද අතර, සිසුන් 60 කට අධික සංඛ්‍යාවක් සඳහා ප්‍රායෝගික රසායනාගාර අත්දැකීම් සහිතව පුහුණුව ලබා දෙන ලදී.

4. 2025 ජනවාරි 16 වන දින SLINTEC හි විශ්ලේෂණ අංශය විසින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIIT) 4 වන වසරේ ද්‍රව්‍ය ඉංජිනේරු සිසුන් සඳහා එක්දින උපකරණ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

5. සහසක් නිමැවුම් 2025 ජාත්‍යන්තර නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනයට සහභාගී වීම: ශ්‍රී ලාංකික නව නිපැයුම් ගෝලීය වේදිකාවට ගෙන ඒම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසම (SLIC) විසින් සංවිධානය කරනු ලැබ 2025 අප්‍රේල් 25 සිට 27 දක්වා පැවති මෙම ප්‍රදර්ශනයේදී සිසුන්, පර්යේෂකයින් සහ සංවිධාන විසින් නවෝත්පාදන ප්‍රදර්ශනය කරනු ලැබිණි.

6. Intex Sri Lanka 2025 සඳහා සහභාගී වීම: Worldtex India Exhibition & Promotion Pvt Ltd විසින් සංවිධානය කරනු ලද 2025 අගෝස්තු 6 සිට 8 දක්වා BMICH හි දී පැවති ප්‍රමුඛතම ජාත්‍යන්තර රෙදිපිළි ප්‍රදර්ශනයේ දී SLINTEC ආයතනය විසින් රෙදිපිළි හා සම්බන්ධ නවෝත්පාදනයන් ප්‍රදර්ශනය කරන ලදී.

7. 2025 කර්මාන්ත ප්‍රදර්ශනයට සහභාගී වීම: කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද, 2025 සැප්තැම්බර් 18 සිට 21 දක්වා, BMICH හිදී පැවති 2025 ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනයේ දී SLINTEC ආයතනය විසින් පර්යේෂණ සහ සංවර්ධන ඉදිරිපත් කරනු ලැබූ අතර, එහි දී SLINTEC ආයතනයේ සෙමින් මුදා හැරෙන යූරියා නැනෝ පොහොර සඳහා බුද්ධිමය දේපළ සහ ආරක්ෂාව යන කාණ්ඩය යටතේ හොඳම නවෝත්පාදන සම්මානය හිමිවිණි.

8. SLINTEC ආයතනයේ ඉරිඟු ලෙලි සහ වී අපද්‍රව්‍ය වලින් නිර්මාණය කරන ලද නව්‍ය කොම්පෝස්ට් කළ හැකි ඇසුරුම් ද්‍රව්‍ය සඳහා 2024 ලංකා ස්ටාර් ඇසුරුම්කරණ සම්මාන උළෙලේදී රන් සම්මානය සහ මිලාන්හිදී පැවති 2025 WorldStar Global Packaging සම්මාන උළෙලේදී තිරසරභාවය පිළිබඳ කාණ්ඩයේ සම්මානය හිමිවිණි. මෙය Modern Pack පෞද්ගලික සමාගම සමඟ සහයෝගයෙන් සාක්ෂාත් කර ගන්නා ලද ජයග්‍රහණයක් විය.

➢ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC)

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC), ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර ජෛව තාක්ෂණ පර්යේෂණ සංවිධාන සමඟ හවුල්කාරිත්වයන් ශක්තිමත් කරමින් ශ්‍රී ලංකාවේ ජෛව තාක්ෂණ පර්යේෂණ අංශය සංවර්ධනය කිරීම සහ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා කැපවී සිටී. ජෛව තාක්ෂණ පර්යේෂණවල විශිෂ්ටත්වය තුළින් ජාතික ආර්ථික සංවර්ධනයට දායක වීම අරමුණු කරගත් වාණිජමය වශයෙන් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති මෙම ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

වසර තුළ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම්හි ප්‍රගතිය පිලිබඳ සාරාංශය

- **SLIBTEC පර්යේෂණ**

පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සලසනු පිණිස අත්‍යවශ්‍ය විද්‍යාගාර උපකරණ මිලදී ගෙන දැනට ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘති සඳහා සහාය වන මෙහෙයුම් විද්‍යාගාරයන් හි ස්ථාපනය කරන ලදී. සෛල රෝපණ විද්‍යාගාරයේ ප්‍රධාන උපකරණ ස්ථාපනය කරන ලද අතර, රසායනික හා පරිභෝජන ද්‍රව්‍ය ගබඩා පහසුකම වැඩිදියුණු කරන ලදී. මෙයට අමතරව, කෘෂි-ජෛව තාක්ෂණ විද්‍යාගාරයට විද්‍යාගාර රසායනික ද්‍රව්‍ය සහ උපකරණ සපයන ලදී.

2025 වසර තුළ, SLIBTEC ආයතනය විසින් ජෛව තාක්ෂණය සහ නිෂ්පාදන සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ජාතික වශයෙන් අරමුදල් සපයන ලද පර්යේෂණ ව්‍යාපෘති හයක් සහ ජාත්‍යන්තරව අරමුදල් සපයන ලද පර්යේෂණ ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රධාන පර්යේෂණ ක්ෂේත්‍ර අතරට වෛද්‍ය ජෛව තාක්ෂණය, ශාක ජෛව තාක්ෂණය, ජාන විද්‍යාව සහ ප්‍රෝටීන විද්‍යාව ඇතුළත් විය.

- **SLIBTEC නවෝත්පාදන උද්‍යානය**

SLIBTEC නවෝත්පාදන උද්‍යානය, උසස් මට්ටමේ ජෛව තාක්ෂණ නිෂ්පාදනයන්ට සහාය ලබාදෙන සහ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට සමත් පරිසර පද්ධතියක් ලෙස සංවර්ධනය කෙරෙමින් පවතී. විද්‍යාව, නවෝත්පාදන සහ වාණිජකරණ අවස්ථා ඒකාබද්ධ කිරීම හරහා ව්‍යවසායකයින් හට නව ව්‍යාපාර හඳුනාගෙන ඒවායේ නියැලීමට හැකියාව ලැබෙන පරිදි නවෝත්පාදන උද්‍යානය නිර්මාණය කර ඇත.

2025 වසරේ දී, ඉඩම් අත්පත් කර ගැනීම සහ තක්සේරු කිරීම සම්බන්ධ නීතිමය ක්‍රියා පටිපාටි සම්පූර්ණ කිරීම, සංකල්පීය සැලසුම් සඳහා වාස්තු විද්‍යාත්මක සේවා ලබා ගැනීමේ ප්‍රගතිය සහ ජල හා විදුලි සැපයුම් යටිතල පහසුකම් ස්ථාපිත කිරීම ඇතුළුව උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලදී.

- **අත්සන් තබනු ලැබූ අවබෝධතා ගිවිසුම් පිලිබඳ තොරතුරු**

- ඇමෙරිකා එක්සත් ජනපදයේ ඔහායෝ ප්‍රාන්තයේ, කොලොම්බස් හි ඔහායෝ ප්‍රාන්ත විශ්වවිද්‍යාලය සහ **SLIBTEC** අතර අවබෝධතා ගිවිසුම.

  ඇමෙරිකා එක්සත් ජනපදයේ ඔහායෝ ප්‍රාන්තයේ කොලොම්බස් හි පිහිටි වෛද්‍ය විද්‍යාලය වෙනුවෙන් ඔහියෝ ප්‍රාන්ත විශ්වවිද්‍යාලය, **SLIBTEC** ආයතනය සමඟ පර්යේෂණ**,** නවෝත්පාදන**,** අධ්‍යාපනික සහ සංස්කෘතික හුවමාරුව සඳහා මෙම විධිමත් ගිවිසුමට එළැඹ ඇත**.**

- ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉලිනොයි විශ්වවිද්‍යාලයේ භාරකාර මණ්ඩලය සහ SLIBTEC අතර අවබෝධතා ගිවිසුම

ඇමෙරිකා එක්සත් ජනපදයේ උර්බානා-චැම්පේන් ඉලිනොයි විශ්ව විද්‍යාලය සහ කාල් ආර්. වෝස් ජානමය ජීව විද්‍යාව සඳහා වූ ආයතනය වෙනුවෙන් ඉලිනොයි විශ්ව විද්‍යාලයේ භාරකාර මණ්ඩලය, **SLIBTEC** ආයතනය සමඟ මෙම අවබෝධතා ගිවිසුමට එළඹ ඇත.

- **සුවිශේෂී ජයග්‍රහණ**

- "වර්ණාවලි ප්‍රවාහ සෛලමිතිය සමඟ සංවර්ධනය වෙමින් පවතින රටවල බෝවන රෝග පිලිබඳ පර්යේෂණ ඉහළ නැංවීම: දැනුම සහ භාවිතයන්" යන මාතෘකාව යටතේ පවත්වනු ලැබූ ICGEB වැඩමුළුව.

  ඉතාලියේ ට්‍රයිස්ටේ හි ජාන ඉංජිනේරු විද්‍යාව සහ ජෛව තාක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB) සඳහා SLIBTEC ආයතනය විසින් "වර්ණාවලි ප්‍රවාහ සෛලමිතිය සමඟ සංවර්ධනය වෙමින් පවතින රටවල බෝවන රෝග පිලිබඳ පර්යේෂණ ඉහළ නැංවීම: දැනුම සහ භාවිතයන්" යන මාතෘකාව යටතේ ජාත්‍යන්තර වැඩමුළුවක් පවත්වන ලදී. වැඩමුළුවේ සමාරම්භක උත්සවය 2025 ඔක්තෝබර් 19 වන දින කොළඹ සිනමන් ලයිෆ් හි දී පැවති අතර වැඩමුළු සැසි 2025 ඔක්තෝබර් 20-24 දක්වා පැවැත්විණි. මෙම වැඩමුළුව සඳහා දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් සහභාගීත්වය දැක්වූවන්ට වර්ණාවලි ප්‍රවාහ සෛලමිතිය පිළිබඳ අති නවීන දැනුම සහ ප්‍රායෝගික පුහුණුව මෙන්ම බෝවන රෝග පිලිබඳ පර්යේෂණවලදී එහි භාවිතයන් පිලිබඳ දැනුම සපයා දෙන ලදී.

➢ ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

ආචාර්ය ඒ.එන්.එස්. කුලසිංහ විසින් සැලසුම් නිර්මාණය කරනු ලැබ 1965 වසරේ දී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය, තාරකා විද්‍යා අධ්‍යාපනය සහ අභ්‍යවකාශ විද්‍යාව ප්‍රජාව වෙත රැගෙන යාම සඳහා පිහිටුවා ඇති මෙරට ප්‍රමුඛතම ආයතනය වන අතර, STEM අධ්‍යාපනය, මහජන විද්‍යා දැනුවත්භාවය සහ තිරසර සංවර්ධන අරමුණු සඳහා දායකත්වයන් දැක්වීම උදෙසා සභාය වන ග්‍රහලෝකාගාර දර්ශන, පාඨමාලා, නිරීක්ෂණ කඳවුරු සහ වැඩමුළු පවත්වනු ලබයි.

ග්‍රහලෝකාගාර දර්ශන සඳහා ඩිජිටල් පූර්ණ අර්ධ ගෝලාකාර චිත්‍රපට, සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ හැඳින්වීමක් සහ රාත්‍රී අහසේ නිරූපණයක් ඇතුලත් වේ. මෙම වැඩසටහන් හරහා සිසුන්ට සහ සාමාන්‍ය ජනතාවට අභ්‍යවකාශය පිළිබඳ වැඩිදුර ඉගෙන ගැනීමේ අවකාශය උදා වේ.

තාරකා විද්‍යාව ප්‍රවර්ධනය කිරීම සහ පාසල් සිසුන්ගේ මෙන්ම මහජනතාවගේ නිරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා රට පුරා රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු සහ ප්‍රදර්ශන පවත්වා ඇත. පියවි ඇසින් සහ දුරේක්ෂ භාවිතයෙන් නිරීක්ෂණය කිරීමෙන් ආකාශ වස්තූන් පිළිබඳ සජීවී අත්දැකීම් ලබා ගැනීමේ හැකියාව මෙවැනි වැඩසටහන් හරහා උදා වේ.

- **වසර තුළ සිදුකළ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පිළිබඳ සාරාංශය**

  2025 වසරේ දී, ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය සිය කාර්යභාරය ඉදිරියට කරා රැගෙන යමින් නිතිපතා අධ්‍යාපනික දර්ශන, තාරකා විද්‍යා වැඩසටහන් සහ සිසුන් සහ මහජනතාව සඳහා ප්‍රජා සම්බන්ධතා ක්‍රියාකාරකම් පැවැත්වීමට කටයුතු කල අතර, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ නරඹන්නන්ගේ අත්දැකීම් වැඩි දියුණු කිරීමට සහ වැඩසටහන් පැවැත්වීම උසස් මට්ටමක් කරා ඉහල නැංවීමට පියවර ගනු ලැබිණි.

- **ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය විසින් අත්කර ගනු ලැබූ සුවිශේෂ ජයග්‍රහණ**

ප්‍රධාන කාර්යසාධන දර්ශකය	**ඉලක්කය**	**අත්කරගත් ජයග්‍රහණ**
පවත්වනු ලැබූ ග්‍රහලෝකාගාර දර්ශන සංඛ්‍යාව	425	467
මුළු නරඹන්නන්ගේ සහභාගීත්වය	300,000	206,030
ආදායම් උත්පාදනය	රු.මිලි.30.00	රු.මිලි.22.09
එළිමහන් වැඩසටහන්	35	19
යටිතල වැඩිදියුණු කර ගැනීම් සඳහා මූලික කාර්යයන්	අර්ධගෝල පියස්ස, වැසිකිළි පද්ධතිය සහ ආපන ශාලාව නවීකරණය	ආපන ශාලා නවීකරණ කටයුතු ආරම්භ කිරීම

➢ **විද්‍යා වැඩසටහන**

2000 වසරේ දී ජාතික මූලාරම්භයක් ලෙස දියත් කරන ලද විද්‍යා වැඩසටහන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති පර්යේෂණ ආයතනවලින් තාක්ෂණය සහ විද්‍යාත්මක දැනුම බිම් මට්ටම වෙත පවරා දීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන මගින් නාගරික සහ ග්‍රාමීය ප්‍රජාවන් අතර තාක්ෂණික පරතරය පියවීමට මෙන්ම අගය එකතු කිරීම හරහා පවතින සම්පත්වල ඵලදායී භාවිතය දිරිමත් කිරීමට කටයුතු කරයි. මෙයට අමතරව, විද්‍යා වැඩසටහන ජීවන තත්ත්වයන් වැඩිදියුණු කිරීමෙන් සහ සාර්ථක ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් බවට පත්වීමට අවශ්‍ය දැනුම සහ තාක්ෂණයෙන් පුද්ගලයින් සවිබල ගැන්වීමෙන් ජාතික ආර්ථික සංවර්ධනයට ද දායක වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී ලංකාව පුරා සියලුම පරිපාලන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් විද්‍යා සම්පත් මධ්‍යස්ථාන (VRC) 315 ක් ස්ථාපිත කර ඇත.

- **සංවර්ධන ව්‍යාපෘති/ වැඩසටහන් සහ ප්‍රගතිය**

- තාක්ෂණ පැවරුම් වැඩසටහන පැවැත්වීම

  රුපියල් මිලියන **2.93**ක වියදමක් යටතේ දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් තාක්ෂණ හුවමාරු වැඩසටහන් **307**ක් පවත්වන ලද අතර**,** එමඟින් ව්‍යවසායකයින් **7,379** දෙනෙකු සඳහා ප්‍රතිලාභ අත්විය. ආහාර තාක්ෂණය**,** තොරතුරු තාක්ෂණය**,** ඉලෙක්ට්‍රොනික විද්‍යාව**,** ඇසුරුම්කරණය සහ ලේබල් කිරීම සහ සත්ව පාලනය වැනි අංශ ආවරණය වන පරිදි මෙම වැඩසටහන් ක්‍රියාත්මක විය.

- **නිලධාරීන්ගේ තාක්ෂණික දැනුම ඉහල නැංවීම සඳහා අදාළ ආයතන සමඟ සහයෝගීතාවයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම.**

  සිය කාර්යභාරයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා හැකියාවන් ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන් (DVOs), විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් (STOs), සංවර්ධන නිලධාරීන් (DOs), ICT සහායකයින්, ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරුන් සහ KKS ඇතුළු නිලධාරීන් 1,150 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 8ක් සාර්ථකව පවත්වන ලදී. මෙම මූලාරම්භය සඳහා රුපියල් මිලියන 3.5ක මුදලක් වැයවිණි. නවෝත්පාදන සහ බුද්ධිමය දේපළ (IP) පිලිබඳ දැනුම ශක්තිමත් කිරීම සඳහා SLIC, NIA සහ NIPO සමඟ සහයෝගීතාවයෙන් විද්‍යා නිලධාරීන් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම් පවත්වන ලද අතර, දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන් සඳහා පේටන්ට් බලපත්‍ර කෙටුම්පත් කිරීමේ වැඩමුළුවක් ද පවත්වන ලදී.

- **නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම**

  2025 වසරේ දී, විද්‍යා සම්පත් මධ්‍යස්ථාන ඇසුරින් බිහි වූ නව නිපැයුම්කරුවන් දෙදෙනෙකු **Industry Expo 2025** හිදී සිය නවෝත්පාදනයන් ප්‍රදර්ශනය කළ අතර, පේටන්ට් බලපත්‍ර අයදුම්පත් **20** ක් **SLIC** වෙත යොමු කෙරිණි. එක් පේටන්ට් බලපත්‍රයක් ලබා දෙන ලද අතර, මෙම මූලාරම්භය රුපියල් මිලියන **0.07** ක වියදමින් ක්‍රියාත්මක කරන ලදී.

- **තත්ත්ව පරීක්ෂණ වාර්තා සහ GMP සහතිකකරණය සඳහා පහසුකම් සැලසීම හරහා සහතිකකරණය සහ තත්ත්ව සහතිකකරණය පහසුකිරීම**

  2025 වසර තුළ දී, විද්‍යා වැඩසටහන යටතේ ආහාර, කුළුබඩු, රූපලාවන්‍ය, රසායනික සහ ඖෂධීය ශාක යන අංශවල කර්මාන්තකරුවන් සඳහා සුදුසුකම්ලත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන හරහා අවශ්‍ය තත්ත්ව සහ ආරක්ෂණ ප්‍රමිතීන් හා අනුකූලත්වය සහතික කරමින් **GMP** සහතික **9**ක් සහ තත්ත්ව පරීක්ෂණ වාර්තා **98**ක් නිකුත් කිරීමට පහසුකම් සපයන ලදී. මෙම මූලාරම්භය සඳහා රුපියල් මිලියන **3.04**ක වියදමක් දරන ලදී.

- **කර්මාන්තකරුවන් සඳහා විකල්ප බලශක්ති ප්‍රභවයන් හඳුන්වාදීම.**

  ඉහළ යන **LP** ගෑස් සහ විදුලි මිල ගණන් හමුවේ නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා කර්මාන්තකරුවන්ට සහාය ලබා දෙනු පිණිස, වවුනියාව, මාතර, කෑගල්ල සහ කළුතර යන දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන් සිව් දෙනෙකු සඳහා රුපියල් මිලියන **0.93** ක් යොදා ගනිමින් සූර්ය පැනල සවි කරන ලදී.

- **කොළඹ විශ්වවිද්‍යාලයේ තාරකා විද්‍යා සංගමය සමඟ සහයෝගීතාවයෙන් තාරකා විද්‍යා දින සහ තාරකා විද්‍යා කඳවුරු සංවිධානය කිරීම.**

  කොළඹ විශ්වවිද්‍යාලයේ තාරකා විද්‍යා සංගමය සමඟ එක්ව, කොළඹ විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා අංශයේ මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ මඟ පෙන්වීම යටතේ, වීරකැටිය මධ්‍ය මහා විද්‍යාලයේ සහ මොරටුව ශාන්ත සෙබස්තියන් විද්‍යාලයේ අහස නිරීක්ෂණ කඳවුරු සාර්ථකව පවත්වන ලදී. මෙම මූලාරම්භය සඳහා රුපියල් මිලියන **0.3** ක වියදමක් දරන ලදී.

- **ජාතික හැකතන් තරඟාවලිය 2025**

  විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ජාතික විද්‍යා සතිය යටතේ, පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන් අතර නවෝත්පාදනයන් පෝෂණය කිරීම උදෙසා, කැලණිය විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතාවයෙන්, ජාතික විද්‍යා පදනමෙහි (**NSF** හි) මූල්‍ය ආධාර යටතේ **HackXJr 8.0** සහ **HackX 10.0** තරඟාවලීන් සාර්ථකව පවත්වන ලදී. දැඩි ඇගයීමකින් පසුව, එක් එක් කාණ්ඩයෙන් ව්‍යාපෘති **33**ක් අවසන් පූර්ව වටයට සහ **15**ක් අවසන් මහා තරඟයට සුදුසුකම් ලැබූ අතර, ගා/කිරිපෙද්ද කනිෂ්ඨ විද්‍යාලය, ඌරාපොළ මධ්‍ය මහා විද්‍යාලය, රෝයල් ඉන්ස්ටිටියුට් ජාත්‍යන්තර පාසල, කැලණිය විශ්වවිද්‍යාලය සහ නෙබියුලා තාක්ෂණ ආයතනයේ කැපී පෙනෙන කණ්ඩායම් සඳහා ඉහළම සම්මාන පිරිනමන ලදී.

- **සේවා හා ආධාරක මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම (Establishment of Incubation Centers)**

  මෙම මූලාරම්භය යටතේ, වවුනියාව විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සහාය ඇතිව සේවා හා ආධාරක මධ්‍යස්ථාන තුනක් ස්ථාපිත කෙරේ. ජාතික තත්ත්ව යටිතල පහසුකම් (**NQI**) වැඩසටහන හරහා එක් මධ්‍යස්ථානයකට ආසන්න වශයෙන් රුපියල් මිලියන **15** ක අරමුදල් සපයනු ලැබේ. මෙම මධ්‍යස්ථාන නව ආහාර නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහා පර්යේෂණ පහසුකම් සපයනු ඇති අතර ව්‍යාපාර සඳහා අත්‍යවශ්‍ය උපදේශන සේවා ලබා

දෙනු ඇත. මෙම මූලාරම්භය සඳහා විද්‍යා වැඩසටහන යටතේ රුපියල් මිලියන **4.0** ක වියදමක් දරන ලදී.

- **ගෝලීය ව්‍යවසායකත්ව සතිය පැවැත්වීම**

  විවිධ පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගනිමින් සහ නවෝත්පාදන, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සහ තරුණ හා කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරමින් දිවයින පුරා පවත්වන ලද ව්‍යවසායකත්ව වැඩසටහන් **579**ක් සමඟින් ගෝලීය ව්‍යවසායකත්ව සතිය සාර්ථකව අවසන් වූ අතර මේ සඳහා රුපියල් මිලියන **0.8**ක වියදමක් දරන ලදී.

2.2. 2026 වර්ෂය සඳහා ඉලක්ක

- ජාතික තත්ත්ව යටිතල පද්ධති වැඩසටහන ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කිරීම
- සමාජයේ සියලු කොටස් ඇතුළත් ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රජා නවෝත්පාදනයන් දියුණු කිරීම
- දිවයින පුරා සේවා හා ආධාරක මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම
- විද්‍යා මධ්‍යස්ථානවල ධාරිතාව, සම්බන්ධතාවය සහ ප්‍රජා බලපෑම වැඩි දියුණු කිරීම
- "The Research and Industry Synergy Forum" වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- විශ්වවිද්‍යාල/ පර්යේෂණ ආයතනවල පර්යේෂණ සොයාගැනීම් වාණිජකරණය කිරීම සඳහා සහාය ලබා දීම
- පර්යේෂණ යෝජනා සකස් කිරීම සහ ඇගයීම සඳහා මාර්ගෝපදේශයක් හඳුන්වාදීම
- පර්යේෂණ ආචාර ධර්ම ඇගයීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම
- පර්යේෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියේ පළමු අදියර සම්පූර්ණ කිරීම
- ජාතික පුරවැසි විද්‍යාත්මක සාක්ෂරතා සමීක්ෂණය පැවැත්වීම
- ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ වැඩසටහන යටතේ තෝරාගත් පර්යේෂණ සහ වැඩමුළු සඳහා ප්‍රදාන ලබා දීම
- 2026 ජාතික විද්‍යා දින සැමරුම් පැවැත්වීම
- ජාතික පාසල් විද්‍යා සමාජ රාමුව දියත් කිරීම
- ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් සහිත අර්ධ ගෝලාකාර ජංගම ග්‍රහලෝකාගාරයක් මිලදී ගැනීම
- අභ්‍යවකාශ විද්‍යාවන්, තාරකා භෞතික විද්‍යාව සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර කෙරෙහි සිසුන්ගේ උනන්දුව දිරිමත් කිරීම සඳහා වැඩමුළු සංවර්ධනය කිරීම
- පූර්ණ අර්ධගෝල චිත්‍රපට දත්ත සමුදාය වැඩිදියුණු කිරීම
- මාර්ගගත ක්‍රමයට ආසන වෙන්කරවා ගැනීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම
- නරඹන්නන්හට ආකාශ සංසිද්ධි සමඟ සෘජුවම සම්බන්ධ වීමට ඉඩ සලසා දෙන අන්තර්ක්‍රියාකාරී ප්‍රදර්ශක භාණ්ඩ ඇතුළත් කිරීම
- පරිසරය සහ තිරසරභාවය සඳහා SLINTEC හි කැපවීම අවධාරණය කරමින් හරිත නවෝත්පාදනයන් කෙරෙහි අවධානය යොමු කිරීම අඛණ්ඩව සිදුකිරීම
- ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ පෙළෙව තාක්ෂණ නවෝත්පාදන මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීම
- SLIBTEC නවෝත්පාදන උද්‍යානය ඉහළ මට්ටමේ පෙළෙව තාක්ෂණ නවෝත්පාදනයන් සඳහා සහාය දක්වන පරිසර පද්ධතියක් සැපයීම සහ ඉහළ වටිනාකමක් ඇති පෙළෙව තාක්ෂණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම අරමුණු කරයි

2.3. අභියෝග

- පුහුණු තාක්ෂණික හා විද්‍යාත්මක කාර්ය මණ්ඩලයේ හිඟය
- නිලධාරීන්ගේ වෘත්තීය ප්‍රගතිය සඳහා පවතින මාර්ග සීමිත වීමෙන් සේවයෙහි රඳවා තබා ගැනීම සහ අභිප්‍රේරණය කෙරෙහි බලපෑම් එල්ල වීම
- වෘත්තිමය නිරාවරණය සහ වෘත්තීය සංවර්ධන අවස්ථා ප්‍රමාණවත් නොවීම
- බොහෝ ආයතන හා මධ්‍යස්ථානවල යල් පැන ගිය උපකරණ සහ යටිතලයන් පැවතීම
- විදාතා නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය සහ පරිපාලනමය බාධා පැවතීම
- විශේෂිත උපකරණවල ඉහළ නඩත්තු සහ මෙහෙයුම් පිරිවැය
- ග්‍රහලෝකාගාරයේ උපරිම නරඹන්නන් සංඛ්‍යාවක් පැමිණෙන කාලවල දී නරඹන්නන් සංඛ්‍යාව සීමා කරන සීමිත ආසන ධාරිතාවක් පැවතීම
- ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය පාසල් සහ ආයතන සඳහා වෙන් කර ගැනීමට බාධාවන් පැවතීම
- විද්‍යාත්මක හා ආර්ථික ප්‍රතිලාභ සඳහා පර්යේෂණ නිෂ්පාදන වාණිජකරණය කිරීමේ අභියෝග

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

නම :

තනතුර :

දිනය

Y.L. Mohamed Navavi
Secretary
Ministry of Science & Technology
03rd Floor, Sethsiripaya Stage I
Battaramulla

පරිච්ඡේදය 03

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

අමාත්‍යාංශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තත්ත්ව 2025 රු.	2024 රු.	
-	ආදායම් ලැබීම්			-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසේ-1
-	ඝාතකත්කර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4		-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිමි		1,743,194,000	-	එසේ-3
-	තැන්පතු		7,726,371	-	එසේ-4
-	අත්තිකාරම් ගිණුම්		17,790,073	-	එසේ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		21,822,506	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		1,790,532,950	-	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		1,790,532,950	-	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		12,522,082	-	
-	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		1,778,010,868	-	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
817,900,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	804,342,565	-	
265,350,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	193,149,451	-	එසේ-2(ii)
1,693,650,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,596,526,965	-	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
2,776,900,000.00	මුළු පුනරාවර්තන වියදම් (උ)		2,594,018,981	-	
	මූලධන වියදම්				
263,300,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	31,647,066	-	
191,200,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	47,126,920	-	
1,650,000,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	12	904,006,861	-	එසේ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
4,500,000.00	හැකියා වර්ධනය	14	2,555,899	-	
864,000,000.00	වෙනත් මූලධන වියදම්	15	793,357,626	-	
2,973,000,000.00	මුළු මූලධන වියදම් (ඌ)		1,778,694,371	-	
	තැන්පතු ගෙවීම්		7,249,513	-	එසේ-4
	අත්තිකාරම් ගෙවීම්		66,985,418	-	එසේ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌෘ)		74,234,931	-	
	මුළු වියදම් එ = (උ+ඌ+ඌෘ)		4,446,948,283	-	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(2,668,937,414)	-	
	අයිමි ඇලැස්ම් ප්‍රකාශනය අනුව ශේෂය		(2,668,937,414)	-	එසේ-7
	දෙසැම්බර් 31 දිනට අයිමි ශේෂය		-		එසේ-3
			-	-	

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශනය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	කත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	49,391,427.14	-
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	49,195,344.92	-
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**98,586,772.06**	-
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(123,488,266.04)	-
දේපළ පිරියත හා උපකරණ සංචිතය		49,391,427.14	-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසීඒ-4	172,683,610.96	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**98,586,772.06**	-

පිටු අංක 01 සිට 60 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 61 සිට 74 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත.** ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය :	දිනය : 2026/02/25
	ඩබ්.එම්. මොහමඩ් නවව්	ඩබ්.ජී.එන්. ප්‍රදීප්
	ලේකම්	ප්‍රධාන ගණකාධිකාරි
	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
	03 වන මහල, සෙත්සිරිපාය I අදියර	3 වන මහල, "සෙත්සිරිපාය" - I අදියර
	බත්තරමුල්ල	බත්තරමුල්ල

2

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

එසිළ-සි

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කළඹ	
	2025 රු.	2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	21,822,506	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	68,511,640	-
අග්‍රිම ලැබීම්	1,743,194,000	-
අත්තිකාරම් අයකර ගැනීම්	28,536,922	-
තැන්පතු ලැබීම්	7,726,371	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,869,791,439	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	943,715,267	-
සහනාධාර සහ මාරුකිරීම්	3,800,129	-
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	793,792,534	-
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	22,412,756	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	12,522,082	-
අත්තිකාරම් ගෙවීම්	43,321,417	-
තැන්පතු ගෙවීම්	7,249,513	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,826,813,699	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	42,977,741	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	42,977,741	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	42,977,741	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(0)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. වාර්තා කිරීමේ පදනම

වාර්තාකිරීමේ පදනම

1) **පිළියෙල කිරීමේ අරමුණ**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7) **මුදල් හා මුදල් සමාන දෑ**

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

අදාල නොවේ

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	2,799,900,000	2,776,900,000	2,594,018,981.05	182,881,018.95
ප්‍රාග්ධන	2,950,000,000	2,973,000,000	1,778,694,370.71	1,194,305,629.29
එකතුව	5,749,900,000	5,749,900,000	4,372,713,351.76	1,377,186,648.24

3.7. මු.රෙ.**208** ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු .


අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	භාවිත කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද ප්‍රතිපාදනයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
	අදාළ නොවේ.					

රු .

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	923,514,058.00	923,514,058.00	-	-
9152	යන්ත්‍රෝපකරණ	823,522,409.22	823,522,409.22	-	-
9153	ඉඩම්	916,818,140.00	916,818,140.00	-	-
9160	ඉදිවෙමින් පවතින ගොඩනැඟිලි	2,112,800,000.00	2,112,800,000.00	-	-

3.9. විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/H/MST/2025/FA/26
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2026 ජූලි 20 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි,
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

ශීර්ෂය 196 - විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 196 - විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මඟහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2025 දෙසැම්බර් 05 දිනැති අංක MOE/YESD/ACC/04/12/2025 දරන ලිපිය අනුව එම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 126 යටතේ වන නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් අංශයෙන් ඉවත් කර, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා තිබූ රු.4,696,550,989ක් වූ වත්කම්වලින් රු.2,264,508ක් වූ වත්කම් හැරුණුවිට රු.4,694,286,481ක් වූ වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2016 අගෝස්තු 17 දිනැති අමප/16/1924/723/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රජයේ දායකත්වයක් සහිතව නව බීම පෙරවැඩුම මධ්‍යස්ථානයේ පිහිටවූ රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්යතා මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නවීකරණය හා වැටුප් වෙතන සඳහා රු.51,000,000ක්ද, රොබෝ තාක්ෂණික උපකරණ මිලදීගැනීම සඳහා 2018 සහ 2019 වර්ෂවල රු.35,000,000ක්ද වශයෙන් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන ලබාදී තිබුණි. එම ප්‍රතිපාදන භාවිතයෙන් අත්පත් කරගන්නා ලද වත්කම්වල වටිනාකම ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශ ප්‍රවාහන අංශය පවත්වාගෙන ඇති වාහන ලේඛනයට අනුව අමාත්‍යාංශය සතුව වාහන 30ක් පවතින අතර ඉන් වාහන 16ක වටිනාකම් වූ රු.136,100,000ක තොරතුරු පරීක්ෂණ විගණනයට ඉදිරිපත් වූ අතර අනෙකුත් වාහන 14හි වටිනාකම් විගණනයට ඉදිරිපත් නොවීය. තවද අමාත්‍යාංශය සතු වාහන 30හි වටිනාකම ගිණුම් ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

1.6.2 තැන්පතු ගිණුම් ශේෂ

2025 මාර්තු මස සිට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා දී ඇති පොදු තැන්පතු ගිණුමෙහි 2018 නොවැම්බර් 26 සිට 2023 දෙසැම්බර් 29 දක්වා කාලසීමාවන්හිදී තැන්පත් කර තිබූ නැනෝ තාක්ෂණ සමාගම ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ රැඳවුම් මුදල් වන රු.172,133,099ක් සමාලෝචිත වර්ෂය තුළද නිරවුල් කර නොතිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොකිරීම

අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 891 ප්‍රකාරව සේවක ඇප ලේඛණයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව සැකසුරුවම්කම සහ කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුතුව ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව හා සම්පූර්ණයෙන් පිළියෙල කළ යුතු වුවද පහත සඳහන් අවස්ථාවල ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 09ක් සඳහා සලසා තිබුණු එකතුව රු.3,650,000ක ශුද්ධ ප්‍රතිපාදන සියයට 100ක් ඉතිරි වී තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 28ක් සඳහා වෙන් කළ එකතුව රු.81,257,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.58,292,187ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඉතිරිවීමේ ප්‍රතිශතය සියයට 52 සිට සියයට 96 දක්වා පරාසයක විය.

(ඇ) මූලධන වැය විෂයයන් 07ක් සඳහා සලසා තිබුණු එකතුව රු.125,000,000ක ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඈ) මූලධන වැය විෂයයන් 11ක් සඳහා සලසාගෙන තිබුණු එකතුව රු.664,384,460ක ශුද්ධ ප්‍රතිපාදනවලින් එකතුව රු.598,439,238ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඉතිරිවීමේ ප්‍රතිශතය සියයට 51 සිට සියයට 99 දක්වා පරාසයක විය.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයට අදාළ පුනරාවර්තන වැය විෂයයන් 36 යටතේ වූ සඳහා එකතුව රු.3,472,560ක වියදම් 2026 වර්ෂය තුළදී ගෙවා තිබුණු නමුත් ඒවා සමාලෝචිත වර්ෂයට අදාළ බැරකම් පිළිබඳ ප්‍රකාශය(SA 92) තුළ ඇතුළත් කර නොතිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිළධාරී /ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිළධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	i. මුදල් රෙගුලාසි 104(1)	රත්නපුර ඉඹුල්පේ විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයේ පරිගණක කාමරයේ 2024 මැයි 26 දින සිදුවූ ගිනිගැනීමට අදාළව මූලික විමර්ශනයක් සිදුකර මාස 03ක් ඇතුළත සිදුවූ අලාභහානි වෙනුවෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වාර්තාව ඉදිරිපත් කර නොතිබූ අතර එම කාමරය අලුත්වැඩියා කරද නොතිබුණි.
	ii මුදල් රෙගුලාසි 756(6)	විද්‍යාතා මධ්‍යස්ථාන 42ක 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණිත දින වන 2026 ජුනි 18 දින වන විටද අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද අමාත්‍යාංශයේ 2025 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සමාලෝචිත වර්ෂය වන විටත් සිදුකර නොතිබුණි.
(ආ)	2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික ඇයවැය චක්‍රලේඛය	චක්‍රලේඛය මගින් ගොඩනැගිලි කුලියට ගැනීම පාලනය සඳහා උපදෙස් ලබාදී තිබුණද, තවදුරටත් 2023, 2024 හා 2025 වර්ෂවලදී කුලී ගිවිසුම් අලුත් කර තිබුණි. එහිදී දිවයින පුරා පිහිටුවා ඇති විද්‍යාතා මධ්‍යස්ථාන 315කින් කුලී පදනමින් පවත්වාගෙන යන මධ්‍යස්ථාන 88ක් වෙනුවෙන් 2025 වර්ෂය තුළ රු. 19,743,417ක වියදමක් දරා තිබුණි.
(ඇ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 වගන්තිය	විද්‍යාතා මධ්‍යස්ථාන 315කින් මධ්‍යස්ථාන 88 ක පැමිණීම පිටවීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

(අ) එක් එක් විද්‍යාගා මධ්‍යස්ථානයේ 2025 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම 2025 වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවත් විද්‍යාගා මධ්‍යස්ථාන 315ට අදාළ 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මාතලේ දිස්ත්‍රික්කයේ විද්‍යාගා මධ්‍යස්ථාන 11ක 2024 වර්ෂයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබීම හා 2025 වර්ෂයේ එක් මධ්‍යස්ථානයකට රු.10,000 බැගින් පමණක් ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් විද්‍යාගා මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණු ඉටුකරගැනීමට හා කාර්යයන් ඵලදායීව ඉටු කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2024 හා 2025 වර්ෂවල දරා තිබුණු වැටුප් හා අනෙකුත් වියදම් වෙනුවෙන් දරා තිබූ එකතු වටිනාකම රු.26,325,269ක් වූ වියදම නිශ්කාර්ය වී තිබුණි.

3.1.2. කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) 2024 සහ 2025 වර්ෂවලදී මහනුවර විද්‍යාගා මධ්‍යස්ථාන 20ක ඊ මාකටින් (E Marketing) පිළිබඳ වැඩසටහන් 20ක් ක්‍රියාත්මක කිරීමට හා 2025 වර්ෂයේ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් යටතේ පොළවල් 240ක් සැලසුම් කර තිබුණද එක් වැඩසටහනක්වත් ක්‍රියාත්මක කර හෝ එකදු පොළක්වත් පවත්වා හෝ නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය සඳහා 2025 වර්ෂයේ වාර්ෂික අයවැය තුළින් රු.275,000,000ක ප්‍රාග්ධන ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණද වර්ෂයේ මුළු ප්‍රාග්ධන වියදම රු.4,380,079ක් වීමෙන් මූල්‍ය ප්‍රගතිය මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් සියයට 1.59ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි. තවද ග්‍රහලෝකාගාරයේ ප්‍රවේශ පත්‍ර Online හරහා වෙන් කිරීම හා සම්බන්ධ අන්තර්ජාල සම්බන්ධතා සහ මෘදුකාංග සංවර්ධනය සඳහා රු.1,500,000ක ප්‍රතිපාදනයක් වෙන් කරගෙන තිබුණද අදාළ කාර්යය සැලසුම් කළ පරිදි ඉටු කර නොතිබුණි.

(ඇ) වාහන නඩත්තු යටතේ වාහන දෙකක් අලුත්වැඩියා කිරීමට රු.500,000ක්ද ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම යටතේ ප්‍රධාන පිවිසුම් දොරටුව යෙදීම, නාම පුවරුව යෙදීම ,දැන්වීම් පුවරු යෙදීම හා උද්‍යාන අලංකරණය සඳහා ඇස්තමේන්තු මගින් රු.500,000ක්ද ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීමට රු.10,000,000ක්ද වෙන්කර තිබුණද , සැලසුම් කළ පරිදි එකී කාර්යයන් ඉටුකර නොතිබීමෙන් මූල්‍ය හා භෞතික ප්‍රගතිය 0ක්ව පැවතුණි.

3.1.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

(අ) අමාත්‍යාංශයේ 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය ශීර්ෂය යටතේ රු.223,500,000ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණද, සැලසුම් කළ පරිදි ග්‍රහලෝකාගාරයේ වහලය ප්‍රතිසංස්කරණය, Dome පලිබෝධ පාලනය, ආපනශාලාව හා වැසිකිළිය අලුත්වැඩියාව සඳහා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් අවසන් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.2,407,813 ක් වූ අතර එය වෙන් කළ ප්‍රතිපාදනයෙන් සියයට 1.07 ක ප්‍රතිශතයක් විය.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම අනුව විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය සැකසීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වර්ෂය තුළ රුපියල් මිලියන 15ක ප්‍රතිපාදන වෙන්කරගෙන ඉන් රු. මිලියන 2.12ක් පමණක් වියදම් කර තිබූ අතර රුපියල් මිලියන 12.88ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. ඒ අනුව එහි මූල්‍ය ප්‍රගතිය සියයට 14ක් වූ අතර භෞතික ප්‍රගතිය හඳුනාගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) පර්යේෂණ ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීමට 2025 වර්ෂයේ රු.මිලියන 10ක ප්‍රතිපාදනයක් වෙන්කරගෙන එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 0.62ක ප්‍රාග්ධන වියදමක් පමණක් දරා තිබූ අතර එහි මූල්‍ය ප්‍රගතිය සියයට 6.2ක්ව පැවතීමෙන් ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්කගත අරමුණු කරා ළඟාවී නොතිබුණි.

(ඈ) ද්විපාර්ශ්වික සහ බහු පාර්ශ්වික සහයෝගීතාව යටතේ විද්‍යා හා තාක්ෂණ සහයෝගීතා පර්යේෂණ කළමනාකරණය සඳහා 2025 ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 40ක් වැය කිරීමට සැළසුම් කර ඉන් රු. මිලියන 8.26ක් පමණක් වැයකර තිබීමෙන් එහි මූල්‍ය ප්‍රගතිය සියයට 21ක් වැනි අඩු මට්ටමක පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාර පරිශ්‍රයේ එළිමහන් ප්‍රදර්ශන 35ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද එළිමහන් ප්‍රදර්ශන 19ක් පමණක් පවත්වා තිබුණි. ඒ අනුව එහි භෞතික ප්‍රගතිය සියයට 54ක මට්ටමක පැවතුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 06ක ප්‍රතිපාදනයක් වෙන් කර ගෙන ඉංදියානු සාගර රිම් සංගමය (IORA) හා සම්බන්ධ සමුද්‍ර පර්යේෂණ ව්‍යාපෘති 2 ක් සිදුකිරීමට සැලසුම් කර තිබුනද සැලසුම් කළ පරිදි පර්යේෂණ සිදු නොකිරීමෙන් එම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය වෙත ළඟා වී නොතිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 45ක් විය.

(උ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා වැය ශීර්ෂය යටතේ රු.7,000,000ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණද ඇස්තමේන්තු කළ පරිදි ප්‍රක්ෂේපකවල අලුත්වැඩියා කටයුතු සිදු කර නොමැති වීමෙන් මෙහි මූල්‍ය ප්‍රගතිය රු.4,300ක් වූ අතර එය වෙන් කළ ප්‍රතිපාදනයෙන් සියයට 0.06ක ප්‍රතිශතයක් විය.

3.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) වේවැල්, පිත්තල, මැටි, ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු.26,140,611ක ප්‍රතිපාදන මත විද්‍යාගා මධ්‍යස්ථාන හරහා 2021 හා 2022 වර්ෂවල නව ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයින් බිහි කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහනක් සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල, ගලේවෙල හා යටවත්ත යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභීන් වෙත ලබාදී තිබුණු යන්ත්‍රෝපකරණ භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. ඒ අනුව අදාළ වැඩසටහනේ මූලික අරමුණ ඉටුවී නොතිබුණි.

(ආ) කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 24ක් සඳහා විද්‍යාගා මධ්‍යස්ථාන හරහා රු.2,113,186ක් වටිනා යන්ත්‍ර උපකරණ බෙදා දී තිබුණු අතර භෞතික විගණන පරීක්ෂාවේදී එම සියලුම උපකරණ ද නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) මාතර දිස්ත්‍රික්කයේ විද්‍යාගා සම්පත් මධ්‍යස්ථාන 11කට අයත් ව්‍යවසායකයින් 31 දෙනෙකු ප්‍රතිලාභියා මිය යාම, විදේශගත වීම, පදිංචිය වෙනස් කිරීමට අපේක්ෂා කිරීම, නිෂ්පාදනය අලෙවි කිරීමට නොහැකි වීම, අමුද්‍රව්‍ය සපයා ගැනීමේ අපහසුතා හා අසනීප මත ව්‍යාපාර කටයුතු නවතා දැමීම හේතුවෙන් ව්‍යවසායකයින්ට ලබා දුන් රු.2,212,395ක නිෂ්පාදන උපකරණ නිෂ්කාර්යව පැවති අතර විද්‍යාගා සම්පත් මධ්‍යස්ථාන 07ක ව්‍යවසායකයින් 12 දෙනෙකු වෙත ලබාදුන් රු.910,653ක උපකරණ අක්‍රීය වීම හේතුවෙන් ව්‍යාපාර කටයුතු නතර කර තිබුණි.

(ඈ) කුරුණෑගල විද්‍යාගා මධ්‍යස්ථානයේ එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයකු බිහිකිරීමේ අරමුණින් සියයට 75ක රජයේ දායකත්වයක් සහ සියයට 25ක ප්‍රතිලාභී දායකත්වයක් මත 2021 වර්ෂයේ ක්‍රියාත්මක කළ උපකරණ බෙදා දීමේ වැඩසටහන යටතේ විද්‍යාගා මධ්‍යස්ථාන 09කට අදාළව රු.25,138,942ක රජයේ දායකත්වයක් සහිතව ප්‍රතිලාභීන් 386 දෙනෙක් සඳහා උපකරණ බෙදා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම උපකරණවල හිමිකම ප්‍රාදේශීය ලේකම් භාරයේ පැවතුණි. මෙහිදී උපකරණ ලබා දීම තුළින් අපේක්ෂිත අරමුණු ළඟා කර ඇත් ද යන්න පිළිබඳ ප්‍රමාණවත් පසු විපරමක් සිදු කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ විද්‍යාගා සම්පත් මධ්‍යස්ථාන 5ක් සතුව පවතින උපකරණ 23ක් මාතලේ දිස්ත්‍රික්කයේ විද්‍යාගා මධ්‍යස්ථාන 06ක යන්ත්‍ර උපකරණ 13ක් හා ගලේවෙල විද්‍යාගා මධ්‍යස්ථානය සතු යතුරුපැදියක් ඌන උපයෝජිතව හා නිෂ්කාර්යව පැවතුණි.

(ආ) මහනුවර දිස්ත්‍රික්කයේ විද්‍යා සම්පත් මධ්‍යස්ථාන 05ක පැවති ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ 68ක් සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාවට නංවා නොතිබුණි.

(ඇ) ග්‍රහලෝකාගාර ගබඩා පරිශ්‍රයේ ප්‍රයෝජනයට නොගන්නා වානේ අල්මාරි 05ක්, ඇම්ප් යන්ත්‍ර 05ක්, පැරණි රූපවාහිනී යන්ත්‍ර 03ක් නිෂ්කාර්යව පැවති අතර ඒවා අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, ග්‍රහලෝකාගාරයේ පුස්තකාල ගොඩනැගිල්ලේ බිත්ති තුළට ජලය කාන්දු වෙමින් බිත්ති ඉරිතලා ගොස් තිබුණු අතර එය භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වෙමින් පැවතුණි. එසේම, ග්‍රහලෝකාගාරයේ ප්‍රේක්ෂකාගාරය, කාර්යාලය හා තාක්ෂණික ගොඩනැගිල්ල තුළ පවතින වටිනා තාක්ෂණික උපාංග හා දිනපතා ටිකටුපත් විකිණීමෙන් ලැබෙන මුදල්වල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) සෙවනගල විද්‍යා මධ්‍යස්ථානය තුළ පරිගණක යන්ත්‍ර (CPU) 05ක් සහ මොනිටර් 05ක් පවතින අතර එම යන්ත්‍ර දැනට භාවිතයේ නොමැති අතර මධ්‍යස්ථානයේ අනාරක්ෂිතව ගබඩා කර තිබුණි.

(ඉ) කවලම විද්‍යා මධ්‍යස්ථානයේ පැවති TVS-Victor වර්ගයේ යතුරුපැදිය 2015 වර්ෂයේ සිට 2025 සැප්තැම්බර් 25 දක්වා වර්ෂ 11ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව මධ්‍යස්ථානයේ ගබඩා කර තිබුණි.

(ඊ) සෙවනගල විද්‍යා මධ්‍යස්ථානයට පුහුණු කටයුතු සඳහා ලබාදී තිබුණු විජලන යන්ත්‍රය, බේකරි උඳුන, පොල්තෙල් යන්ත්‍රය, දර වාෂ්ප ලිප, යෝගට් මුදවනය, පොල්ලෙළි ඉවත් කරන යන්ත්‍රය පුහුණු වැඩසටහන් සඳහා යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 පරිදි අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති දායතනවල ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.

3.4 පාඩු හා හානි

අමාත්‍යාංශයට අයත් මෝටර් වාහනයක 2025 ජුනි 08 දින වූ අනතුරක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබූ අතර හානියේ මුලු වටිනාකම, හානියට හේතුව අනාවරණය වී නොතිබුණි. 2026 මැයි 31 වන විටද වාහනය අලුත්වැඩියා කර නොතිබූ අතර එම අනතුරේ හානිය හා පාඩුව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) විද්‍යා සම්පත් මධ්‍යස්ථාන හා ප්‍රජාව අතර සම්බන්ධතාවය පවත්වා ගනිමින් ග්‍රාමීය මට්ටමේ ව්‍යවසායකයන් හඳුනා ගැනීමේ දී විද්‍යා ව්‍යවසායක සමිති පිහිටුවීම හා පවත්වාගෙන යාම

කෙරෙහි අවධානය යොමු කර නොතිබුණු අතර පරීක්ෂාවට ලක් කරන ලද විද්‍යාගාර මධ්‍යස්ථාන 09ක් අතරින් කොබෙයිගනේ, පඬුවස්නුවර බටහිර, කුලියාපිටිය නැගෙනහිර හා තාරම්මල මධ්‍යස්ථානවලට අනුබද්ධිතව විද්‍යාගාර ව්‍යවසායක සමිති පිහිටුවා නොතිබුණි. තවද, මහනුවර දිස්ත්‍රික්කයේ මධ්‍යස්ථාන 18ක විද්‍යාගාර ව්‍යවසායක සමිති අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

(ආ) එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්තකරුවෙක් බිහිකිරීමේ ජාතික වැඩසටහන යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ විද්‍යාගාර සම්පත් මධ්‍යස්ථාන හරහා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් තෝරාගෙන තිබූ ප්‍රතිලාභීන් 100 දෙනෙකුට උපකරණ බෙදා දී නොතිබුණු අතර අනුමත නොකරන ලද ප්‍රතිලාභීන් 31 දෙනෙකුට එම උපකරණ ලබාදී තිබුණි.

(ඇ) විද්‍යාගාර මධ්‍යස්ථානවල අරමුණු හා කාර්යභාරය නිවැරදිව් හඳුනාගෙන එය ඉටුකරගැනීමට මධ්‍යස්ථානවල මානව හා භෞතික සම්පත් පූර්ණව උපයෝජනය වන පරිදි සැලසුම්කරණයන් සිදුව නොතිබීම හේතුවෙන් වර්ෂයේ වැඩකරන දිනවලින් වැඩි ප්‍රමාණයක් එම මධ්‍යස්ථානවල කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.

(ඈ) (i) ග්‍රහලෝකාගාරයේ ක්ෂේත්‍රාගාරයේ 2014 වර්ෂයේ දී සවිකරන ලද තවීන තාක්ෂණයෙන් යුතු Multifunction's full dome planetarium projector යන්ත්‍රයේ South Projector කොටස 2022 අගෝස්තු මාසයේ සිට සම්පූර්ණයෙන් අක්‍රිය වී තිබූ අතර එම යන්ත්‍රයේ North Projector කොටස මගින් පමණක් ග්‍රහලෝකාගාර දර්ශන අර්ධයක් ලෙස පමණක් පෙන්නුම් කෙරේ.

(ii) විශ්වයේ ඇතිවන තාරකා විද්‍යාත්මක සංසිද්ධි පැහැදිලි කිරීමට හා ග්‍රහලෝකාගාර වෙත පැමිණෙන නරඹන්නන්ට එම සංසිද්ධි පිළිබඳ අත්දැකීමක් ලබාදීමේ අරමුණින් ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාර පරිශ්‍රය තුළ තාක්ෂණික උද්‍යානය ස්ථාපිත කර තිබුණද එහි පැවති උපකරණ බොහොමයක් කැඩී ක්‍රියාවිරහිතව පැවතුණි. තවද තාරකා විද්‍යා දැනුම පාසල් ළමුන් හට ලබාදීමට ස්ථාපිත කර තිබූ ජංගම ග්‍රහලෝකාගාරය වසර 02ක පමණ සිට අක්‍රීය තත්ත්වයේ පවතුණි.

(iii) 1968 වර්ෂයේ සිට වසර 59ක් ග්‍රහලෝකාගාරයට නිරවුල්ව භුක්තිය පැවති කොළඹ විශ්ව විද්‍යාලය ආසන්නයේ පිහිටා ඇති හෙක්ටයාර් 0.7021ක් වූ ඉඩමේ අයිතිය නිරවුල්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) (i) අමාත්‍යාංශය යටතේ පවතින සී/ය ශ්‍රී ලංකා නැනෝ ටෙක්නොලොජි (පුද්) සමාවර්ෂයේදී ද බයෝ ටෙක්නොලොජි (පුද්) සමාගම 2022 වර්ෂයේදී ආරම්භ කර ඇති අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 9,000කට ආසන්න මුදලක් භාණ්ඩාගාර ප්‍රතිපාදන ඒකී සමාගම් 2ට යොදවා ඇත. මෙම සමාගම් ආරම්භ කිරීම හා මුදල් ආයෝජනය කිරීම තුළින් අරමුණු කර තිබුණු පරිදි නැනෝ තාක්ෂණය හා බයෝ තාක්ෂණය සම්බන්ධ පර්යේෂණ සිදුකර ඵලදායී සොයාගැනීම් සහ එකතු කිරීම් රටට දායාද කර දීමට අදාළව ප්‍රමාණවත් කාර්යසාධනයක් පෙන්නුම් කර නොතිබුණි. තවද එකී සමාගම් ප්‍රමාණවත් ආදායම් නොලැබීම හා අඛණ්ඩව අලාභ ලැබීම තුළ ඒවායේ අඛණ්ඩ

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව දමාක්‍යාංශයක අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවද අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක තනතුර 2025 ජනවාරි සිට 2026 ජනවාරි දක්වාම පුරප්පාඩුව පැවතුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව 2025 වර්ෂය තුළ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) අමාත්‍යාංශය සතු වාහන 30කින් වෙනත් ආයතන වෙත ලබා දී ඇති වාහන 14 හැරුණු කොට වාහන 16ක් පවතින අතර අමාත්‍යාංශය වෙත අනුමත රියදුරු සංඛ්‍යාව 25ක් වුවද, තත්‍ය රියදුරු සංඛ්‍යාව 7ක් වීමෙන් රියදුරු පුරප්පාඩු 18ක් පැවතුනි.

(ආ) මහනුවර විද්‍යා සම්පත් මධ්‍යස්ථාන 02ක නිලධාරීන් දෙදෙනෙක් අතිරික්තයක් ලෙස යොදවාගෙන තිබියදී නිලධාරීන් නොමැතිවීම හේතුවෙන් උඩුදුම්බර විද්‍යා මධ්‍යස්ථානය 2025 ජූලි මස වසා දමා තිබුණි.

එම්.ඩී. සුදර්ශනී අමරතුංග
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04

කාර්යසාධන දර්ශක

4.1. කාර්යසාධන නිර්ණායකයන් (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂ නිර්ණායකයන්	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
	100%-90%	**75%-89%**	**50%-74%**
පිරිනමනු ලැබූ පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව		√	
ස්ථාපනය කරන ලැබූ ඒකාබද්ධ පර්යේෂණ/ පර්යේෂණ - කර්මාන්ත සහයෝගීතා සංඛ්‍යාව	√		
ප්‍රකාශයට පත් කරනු ලැබූ පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව	√		
ලබාගත් දේශීය/ජාත්‍යන්තර ඇගයීම් සංඛ්‍යාව	√		
ලබාගත් දේශීය/ ජාත්‍යන්තර පේටන්ට් සංඛ්‍යාව			√
විද්‍යාව ප්‍රචලිත කිරීම අරමුණු කරගනිමින් පවත්වනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව	√		
විද්‍යාව ප්‍රචලිත කිරීම අරමුණු කරගනිමින් පවත්වනු ලැබූ වැඩසටහන් සඳහා සහභාගී වූ සංඛ්‍යාව	√		
ප්‍රකාශයට පත්කරනු ලැබූ විද්‍යා ක්ෂේත්‍රය හා සම්බන්ධ ප්‍රකාශනයන් සංඛ්‍යාව	√		
දේශීය/ ජාත්‍යාන්තර වශයෙන් අත්සන් තබනු ලැබූ තාක්ෂණය පවරාදීම් පිළිබඳ ගිවිසුම් සංඛ්‍යාව			√
දේශීය/ ජාත්‍යාන්තර වශයෙන් වාණිජකරණය සිදුකළ පර්යේෂණ නිපැයුම් සංඛ්‍යාව			√
වාණිජකරණය සඳහා මූල්‍යමය සහාය ලබාදුන් නව නිපැයුම් සංඛ්‍යාව		√	
දේශීය/ ජාත්‍යාන්තර වශයෙන් අත්සන් තබනු ලැබූ විද්‍යාව, නවෝත්පාදන සහ තාක්ෂණ සහයෝගීතාවයන්		√	
සාර්ථකව නිම කළ විද්‍යාව, නවෝත්පාදන සහ තාක්ෂණ සහයෝගීතාවයන්	√		
ලබා දුන්/පහසුකම් සලසන ලද PhD සහ Mphil සංඛ්‍යාව	√		

පරිච්ඡේදය 05
තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීම පිළිබඳව කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්ක/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ පිළිබඳ දර්ශක	මේ දක්වා අත්කර ගනු ලැබ ඇති ජයග්‍රහණයන්හි ප්‍රගතිය		
			0% - 49%	**50% - 74%**	**75% - 100%**
2.කුසගින්න ශූන්‍ය කිරීම	2.1. 2030 වන විට, කුසගින්න තුරන් කර, සියලු ජනතාවට, විශේෂයෙන් දුප්පතුන්ට සහ ළදරුවන් ඇතුළු අවදානමට ලක්විය හැකි තත්වයන් යටතේ සිටින ජනතාවට, වසර පුරා ආරක්ෂිත, පෝෂ්‍යදායී සහ ප්‍රමාණවත් ආහාර සඳහා ප්‍රවේශය සහතික කිරීම.	2.1.1 ඌන පෝෂණ ප්‍රතිශතය 2.1.2 ආහාර අනාරක්ෂිතභාවය පිළිබඳ අත්දැකීම් පරිමාණය (FIES) මත පදනම්ව, ජනගහනය තුළ මධ්‍යස්ථ හෝ දැඩි ආහාර අනාරක්ෂිතභාවයේ ප්‍රතිශතය			
	2.3.ඉඩම්, අනෙකුත් නිෂ්පාදන සම්පත් සහ යෙදවුම්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොළ සහ අගය එකතු කිරීමේ සහ ගොවිපල නොවන සේවා යෝජකයින් සඳහා ආරක්ෂිත සහ සමාන ප්‍රවේශයක් හරහා ඇතුළුව2030 වන විට, කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන් කාන්තාවන්, ආදිවාසී ජනතාව, ගොවි පවුල් , එඬේරුන් සහ ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම දෙගුණ කරන්න.	2.3.1 ගොවිතැන්/එඬේර/වන වගා ව්‍යවසාය පන්තියේ ප්‍රමාණය අනුව ශ්‍රම ඒකකයකට නිෂ්පාදන පරිමාව			√
	2.4 2030 වන විට, තිරසර ආහාර නිෂ්පාදන පද්ධති සහතික කිරීම සහ ඵලදායිතාව සහ නිෂ්පාදනය වර්ධනය කරන, පරිසර පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන, දේශගුණික විපර්යාස, ආන්තික කාලගුණය,	2.4.1 ඵලදායී හා තිරසර කෘෂිකර්මාන්තය යටතේ පවතින කෘෂිකාර්මික භූමි ප්‍රමාණයේ අනුපාතය			

	නියහය, ගංවතුර සහ අනෙකුත් ව්‍යසනයන්ට අනුවර්තනය වීමේ ධාරිතාව ශක්තිමත් කරන සහ භූමියේ සහ පසෙහි ගුණාත්මකභාවය ක්‍රමයෙන් වැඩිදියුණු කරන ඔරොත්තු දෙන කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.				
4. පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	4.3 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට සම අවස්ථා සහතික කිරීම	4.3.1. වෘත්තිය අධ්‍යාපන ක්ෂේත්‍රයේ වයස අවු. 15-24 ත් අතර තරුණ ජනගහනයේ සහභාගීත්ව ප්‍රතිශතය		√	
	4.4. 2030 වනවිට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම	4.4.1. තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය ක්ෂේත්‍රයට බඳවාගත් සිසුන් එම ක්ෂේත්‍රය සඳහා බඳවාගැනීමට අපේක්ෂාකළ සිසුන් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස			√
	4.5 2030 වනවිට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම හා ආබාධිත පුද්ගලයන්ට, ස්වදේශිකයන්ට සහ අවධානම් අවස්ථාවල සිටින ළමුන් ඇතුළු අවධානමට ලක්විය හැක්කන් සඳහා අධ්‍යාපනයේ සහ වෘත්තීය පුහුණුවෙහි සියලුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම	4.5.1. වෘත්තීය පුහුණුව අවසන් කළ ස්ත්‍රී ශිෂ්‍ය සංඛ්‍යාව වෘත්තීය පුහුණුව අවසන් කළ පුරුෂ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස			√

8. සුනිසි කාර්යයන් සහ ආර්ථික වර්ධනය	8.2 ඉහළ අගය එකතු කළ සහ ශ්‍රම-දැඩි අංශ කෙරෙහි අවධානය යොමු කිරීම ඇතුළුව විවිධාංගීකරණය, තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ නවෝත්පාදනයන් හරහා ඉහළ ආර්ථික ඵලදායීතා මට්ටමක් ළඟාකර ගැනීම	8.2.1 එක් රැකියා නියුක්තිකයෙකුට සත්‍ය දළ දේශීය නිෂ්පාදිතයෙහි වාර්ෂික වර්ධන අනුපාතය			√
9. සවිමත් යටිතලයන් ගොඩනැංවීම, අංගසම්පූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය සහ නවෝත්පාදනය පෝෂණය කිරීම	9.5 නවෝත්පාදන දිරිමත්කිරීම සහ මිලියන 1ක ජනගහනයක් සඳහා සිටින පර්යේෂණ හා සංවර්ධන අංශයේ සේවකයන් සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පර්යේෂණ වියදම් සැලකිය යුතු අන්දමින් ඉහළ දැමීම හරහා 2030 වර්ෂය වනවිට, සංවර්ධනය වෙමින් පවතින රටවලට සුවිශේෂීව, සියලු රටවල්හි විද්‍යාත්මක පර්යේෂණ හා කාර්මික අංශයේ තාක්ෂණික හැකියාවන් ඉහළ නැංවීම	9.5.1 "පර්යේෂණ සහ සංවර්ධන වියදම්, දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් ලෙස"			√
	9. ආ. කාර්මික විවිධාංගීකරණය සහ පාරිභෝගික භාණ්ඩ සඳහා අගයන් එක් කිරීම හරහා හිතකර ප්‍රතිපත්තිමය පරිසරයක් සහතික කරමින්, සංවර්ධනය වෙමින් පවතින රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය, පර්යේෂණ හා නවෝත්පාදන සඳහා සහාය ලබා දීම	9 ආ.1 "අගය එක් කළ මධ්‍යම සහ අධි-තාක්ෂණික කර්මාන්ත නිෂ්පාදිතයන්, සමස්ත අගය එක් කළ නිෂ්පාදිතයන්හි අනුපාතයක් ලෙස"			√

5.2. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අභියෝග සහ ජයග්‍රහණයන්

අභියෝග

- පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා නිරන්තරයෙන් අඩු සහ අනපේක්ෂිත අයුරින් ආයෝජන සිදුකිරීම හේතුවෙන්, තිරසර සංවර්ධන අරමුණු 9 සමඟ අනුකූලතාව දක්වන දිගුකාලීන, මෙහෙවර-නැඹුරු වැඩසටහන් සීමා වීම . NIFS සහ ITI වැනි ආයතන වාර්ෂික රජයේ ප්‍රතිපාදන සහ තරඟකාරී ප්‍රදාන මත දැඩි ලෙස රඳා පවතින අතර, ඒ හේතුවෙන් උපායමාර්ගික අඛණ්ඩතාව සහ මහා පරිමාණ තාක්ෂණ සංවර්ධනය සීමා වේ.

- ජාතික තිරසර සංවර්ධන ඉලක්ක සැලසුම්කරණය සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයන් සමඟ පර්යේෂණ ප්‍රතිදානයන් සීමිත ලෙස ඒකාබද්ධ කිරීම (SDG 9; SDG 17). උදාහරණයක් ලෙස, NIFS මූලික විද්‍යාත්මක දැනුම ජනනය කරන අතර, දුර්වල ප්‍රතිපත්ති-පර්යේෂණ සම්බන්ධතා හේතුවෙන් නියාමන රාමු සහ ජාතික සංවර්ධන උපාය මාර්ග බවට සාක්ෂි පරිවර්තනය කිරීම අඩු වේ.

- රජයේ ආයතන, නියාමන ආයතන, පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ කර්මාන්ත අතර ප්‍රමාණවත් ආයතනික ජාල සහ සම්බන්ධීකරණයක් නොමැති වීම (SDG 17: ඉලක්ක සඳහා හවුල්කාරිත්වයන්) මූලාරම්භයන් ආරම්භ වී ඇතත්, සහයෝගිතා පරතරයන් හේතුවෙන් තවමත් වාණිජකරණය, නියාමන එකඟතාවය සහ කර්මාන්ත වලදී භාවිතය සඳහා බාධා එල්ල වන අතර , විශේෂයෙන් ITI, NERDC, ACCIMT, SLIBTEC සහ SLINTEC මෙහෙයුම් වලදී මෙය දක්නට ලැබේ.

- කුසලතා සහිත විද්‍යාත්මක, තාක්ෂණික සහ පරිපාලන නිලධාරීන්ගේ හිඟය (SDG 4: ගුණාත්මක අධ්‍යාපනය; SDG 8). SLIC, NSF, SLAERC සහ NERDC බඳවා ගැනීමේ ප්‍රමාදයන්ට මුහුණ දෙන අතර, NIFS සහ ITI යන ආයතනයන් හී විශේෂිත පර්යේෂකයින් ආකර්ෂණය කර ගැනීම සහ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් බාධාවන්ට මුහුණ දෙයි.

- රජයේ වැටුප් ව්‍යුහයන් හේතුවෙන් සුදුසුකම් ලත් වෘත්තිකයන් රඳවා තබා ගැනීමේ දුෂ්කරතා සහ බඳවා ගැනීම් හා සසඳන විට ඉහළ ඉල්ලා අස්වීමේ අනුපාත (SDG 8), විශේෂයෙන් ITI හි දක්නට ලැබේ.

- බුද්ධි ගලනය සහ අති නවීන ගෝලීය පර්යේෂණ පරිසරයන්ට (SDG 8; SDG 10: අසමානතා අඩුකිරීම) සීමිත නිරාවරණය, විශේෂයෙන් මූලික හා අන්තර් විෂයානුබද්ධ විද්‍යාවන්හි දී දිගුකාලීන ආයතනික ධාරිතාව සහ අඛණ්ඩතාවයට බලපායි.

- යල් පැන ගිය රසායනාගාර යටිතල පහසුකම් සහ ඩිජිටල් පද්ධති (උදා: ITI හි ERP සහ LIMS වේදිකා) සහ නවීකරණය සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන අරමුදල් නොමැතිවීම (SDG 9) හේතුවෙන් , අති නවීන පර්යේෂණ සිදු කිරීමට සහ කාර්යක්ෂම සේවා සැපයීමට ඇති හැකියාව සීමා වී ඇත.

- පවතින ආයතනික පනත් යටතේ ඇති ව්‍යවස්ථාපිත සීමාවන් ඇතැම් පර්යේෂණ ආයතන (උදා: ITI) ව්‍යාපාරික කටයුතු, වාණිජ නිෂ්පාදනය සහ නිෂ්පාදන අලෙවිය සඳහා සෘජුවම සම්බන්ධ වීම වළක්වයි. මෙම නීතිමය සීමාවන්, ව්‍යුහගත වාණිජකරණ රාමුවක් නොමැතිකම සමඟ එක්ව, තාක්ෂණ පැවරුම්, අතුරු නිෂ්පාදන නිර්මාණය, ආදායම් උත්පාදනය සහ දිගුකාලීන මූල්‍ය ස්වයංපෝෂිතභාවය සැලකිය යුතු ලෙස සීමා කරයි (SDG 9; SDG 8; SDG 16: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන).

- ජෛව තාක්ෂණය වැනි විශේෂිත අංශවල (SLIBTEC විසින් ඉස්මතු කර ඇති පරිදි) අඩු මහජන දැනුවත්භාවය සහ දේශීය වෙළඳපලෙහි සීමිත සංවර්ධනය, නවෝත්පාදන සහ තිරසර සංවර්ධන අරමුණු ආශ්‍රිත මූලාරම්භයන් සඳහා සමාජීය සහභාගීත්වය අඩු කිරීමට හේතු වේ. (SDG 12: SDG 12: වගකිවයුතු පරිභෝජනය සහ නිෂ්පාදනය; SDG 17).

ජයග්‍රහණ

- ප්‍රධාන තාක්ෂණ වේදිකාවල (SDG 9; SDG 4) හොඳ මෙහෙයුම් ධාරිතාවක් අත්කර ගනිමින් SLIBTEC සහ SLINTEC හි දියුණු පර්යේෂණ යටිතල පහසුකම් සහ නියමු පරිමාණ පහසුකම් හරහා ජාතික විද්‍යාත්මක හා තාක්ෂණික ධාරිතාව වැඩිදියුණු කිරීම.
- කාර්මික තාක්ෂණ ආයතනය (ITI) විසින් එම ආයතනයට පැවරී ඇති කාර්යභාරය තුළ ප්‍රතීතන පරීක්ෂණ, විශ්ලේෂණ සේවා සහ ව්‍යවහාරික පර්යේෂණ සහ සංවර්ධන අඛණ්ඩව සපයා දීම මගින් පෙන්නුම් කර දී ඇති පරිදි ආර්ථික බාධක නොතකා තිරසර සංවර්ධන අරමුණු හා අනුකූලතාව දක්වන සේවා සහ පර්යේෂණ තිරසර ලෙස සැපයීම (SDG 9).
- BFBF පොහොර, පාංශු සෞඛ්‍යය වැඩිදියුණු කිරීමට සහාය වීම, ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ වගකිවයුතු යෙදවුම් භාවිතය වැනි තාක්ෂණික ව්‍යාප්තිය තුළින් තිරසර කෘෂිකර්මාන්තයට සහ පාරිසරික භාරකාරත්වයට දායක වීම (SDG 2: ශූන්‍ය කුසගින්න; SDG 8).
- විශ්ලේෂණාත්මක නිරවද්‍යතාවය, තාක්ෂණික වලංගුකරණය සහ කර්මාන්ත සේවා සැපයීම වැඩි දියුණු කරමින් උසස් මට්ටමේ විද්‍යාත්මක උපකරණ මිලදී ගැනීම සඳහා NQI අයවැය ප්‍රතිපාදන හඳුනා ගැනීම සහ භාවිතා කිරීම (SDG 9).
- දේශගුණික අනුවර්තනය, තිරසර කාර්මිකකරණය සහ සම්පත් කාර්යක්ෂමතාව වැනි ක්ෂේත්‍රවල සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සංවර්ධනය සහ දිගුකාලීන ජාතික ඔරොත්තු දීමේ හැකියාව සඳහා සහාය පල කරමින් ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS) විසින් භෞතික, රසායනික, ගණිතමය සහ ස්වාභාවික විද්‍යාවන් හි මූලික දැනුම පදනමක් සැපයීම (SDG 9).

පරිච්ඡේදය 06
මානව සම්පත් පැතිකඩ

6.1. 2025.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව		දැනට සිටින සේවක සංඛ්‍යාව		පුරප්පාඩු / අතිරික්තය	
	අමාත්‍යාංශය	විදාතා	අමාත්‍යාංශය	විදාතා	අමාත්‍යාංශය	විදාතා
ජ්‍යෙෂ්ඨ	32	11	16	08	16	03
තෘතීයික	06	27	05	23	01	04
ද්විතීය	63	654	53	657	12	08
ප්‍රාථමික	52	249	12	235	40	14
එකතුව	**153**	**941**	**86**	**923**	**69**	**29**

6.2. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණුලාභී නිලධාරින් සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය	වැඩසටහනේ ස්වභාවය		නිමැවුම/ලබාගත් දැනුම
				විදේශීය	දේශීය	
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන	45	දින 01	169,465		දේශීය	නිලධාරීන්ගේ දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම මගින් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩි දියුණු
සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමේ වැඩසටහන සහ කැබිනට් පත්‍රිකා කෙටුම්පත් කිරීම	60	දින 01	57,300		දේශීය	
ප්‍රසම්පාදන ක්‍රියාවලිය (SDFL)	04	දින 02	52,000		දේශීය	
ප්‍රවාහන කළමනාකරණය (SDFL)	02	දින 01	14,000		දේශීය	

රජයේ වැටුප් ක්‍රමය (දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය)	01	දින 02	11,500		දේශීය	කිරීම.
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	85	දින 01	94,237		දේශීය	
අලුතින් පත් කරන ලද සේවා නිලධාරීන් සඳහා සේවානියුක්ති පුහුණුව	16	දින 01	25,700		දේශීය	
නිවාඩු ලිපිකරුගේ යුතුකම් සහ වගකීම්	01	දින 02	13,000		දේශීය	
සිවිල් සේවා නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහය සහ මූල්‍ය රෙගුලාසි	16	දින 02	189,000		දේශීය	
E - Government ප්‍රසම්පාදන පුහුණුව	45	දින 02	48,759		දේශීය	
ආතති කළමනාකරණ පුහුණු වැඩසටහන	40	දින 01	21,131		දේශීය	
පෞද්ගලික ගොනුවක් පවත්වාගෙන යාම	02	දින 02	26,000		දේශීය	
කා.කා.ස. සහ රියදුරන්ගේ ආකල්ප සහ වෘත්තීය දැනුම වැඩිදියුණු කිරීම.	04	දින 01	37,500		දේශීය	
වැටුප් පරිවර්තන	02	දින 02	26,000		දේශීය	
AI පුහුණුව	50	දින 01	41,400		දේශීය	
සටහන්, ලිපි සහ වාර්තා ලිවීම	10	දින 01	70,000		දේශීය	
ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් හැදෑරීමට (SLIDA)	01	වසර 01	90,000		දේශීය	
			986,992			

චීනය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සංවර්ධන සහ දරිද්‍රතාවය පිටුදැකීමේ ක්ෂේත්‍රයේ අත්දැකීම් හුවමාරුව පිළිබඳ සම්මන්ත්‍රණය	02	2025.03.21 සිට 2025.04.06 දක්වා	අනියම් දීමනාව: $375 ($25 \දින 15) අනියම් දීමනාව: $375 ($25 \දින 15) උණුසුම් ඇඳුම් දීමනාව: £75	විදේශීය චීනය		ඉලක්කගත දරිද්‍රතාවය පිටුදැකීමේ උපාය මාර්ග, ඊ-වාණිජ්‍යය හරහා ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සහ ප්‍රජා බලගැන්වීම වැඩිදියුණු කිරීම සඳහා නවීන කෘෂිකාර්මික තාක්ෂණික නවෝත්පාදන යන් පිළිබඳ දැනුම ලබා ගැනීම.
විද්‍යා හා තාක්ෂණ හුවමාරුව පිළිබඳ දෙවන Belt and Road සමුළුව (BRST සමුළුව) එන්.ඒ.එම්.ඩී.එන්. නවරත්න මහතා	01	2025.06.09 to 2025.06.13	අනියම් දීමනාව: $200 ($40 \දින 5) $ උණුසුම් ඇඳුම් දීමනාව: £75	විදේශීය චීනය		ජාත්‍යන්තර විද්‍යාත්මක හා තාක්ෂණික සහයෝගිතා රාමු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, Belt and Road මූලාරම්භය තුළ නව්‍ය පර්යේෂණ උපාය මාර්ග බෙදා ගැනීම සහ අනාගත සහයෝගී තාක්ෂණ පැවරුම් සහ දැනුම හුවමාරුව සඳහා වෘත්තීය ජාල ස්ථාපිත කිරීම.
චීනයේ Global Security Initiative යටතේ සයිබර් ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය (සුමිත්‍රා ගීතානි	01	2025.06.14 to 2025.06.30	අනියම් දීමනාව : $375 ($25 \දින 15) උණුසුම්	විදේශීය චීනය		සයිබර් අපරාධ වලට එරෙහිව සටන් වැදීම , දත්ත ස්වාධීනත්වය සහ ජාල

කන්නන්ගර මිය)			ඇදුම් දීමනාව : £75			ආරක්ෂාව සඳහා නැගී එන තාක්ෂණයන් යෙදීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ අවබෝධය වැඩි දියුණු කර ගැනීම . සයිබර් තර්ජන හඳුනා ගැනීමේ සහ ගෝලීය ආරක්ෂක ප්‍රොටෝකෝලවලට අනුකූල ජාතික මට්ටමේ ආරක්ෂක උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ කුසලතා වර්ධනය කර ගැනීම.

පරිච්ඡේදය 07
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිවරදි කිරීමේ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්.	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්).	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්.	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්.	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම. (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.`	අනුකූල වේ		

2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.9	භාණ්ඩ පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**	අනුකූල වේ		
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	සමාලෝචිත වර්ෂ සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය සම්මත කරගෙන තිබීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට	අනුකූල වේ		

	මහාභාණ්ඩාගාරය වෙත ඉදිරිපත්කර තිබීම.			
5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6.	**අභ්‍යන්තර විගණනය මු,රෙ.134(2)**			
6.1	මු,රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.		අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු
6.2	සියළු අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මසක් ඇතුළත පිළිතුරු සපයා තිබීම.			
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.			
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම		අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු
7.	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම.			
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිළදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම.	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කරතිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109,හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10.	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළකර සහතිකකර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල්කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල්කර තිබීම.	අනුකූල වේ		
11.	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම්වලට එළඹීම.	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ		
12.	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල්කර තිබීම.	අනුකූල වේ		
13.	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතුකර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීනකර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14.	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණයකර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල්කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරුඅග්‍රිම නිකුත්කර තිබීම.	අනුකූල වේ		

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15.	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අදාළ නැත		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
17.	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට	අනුකූල වේ		

	ක්‍රියාත්මකකර තිබීම.			
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම්කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		අයවැය චක්‍රලේඛ 3/2022 ට අනුකූලව රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය පුහුණු වැඩසටහන් අවස්ථා ලබා දීමට පියවර ගෙන ඇත.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන්කර තිබීම.	අනුකූල වේ.		.
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවරධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20.	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.		

Ministry of Science & Technology
3rd Floor, Sethsiripaya
Battaramulla
Sri Lanka